ජෝයිස් මේය

# බිඳුණු හදවත සුවකිරීම



දෙවියන්වහන්සේගේ වචනයේ බලය කරණකොටගෙන ප්‍රතිෂ්ඨාපනය අත් දැකීම

# බිඳුණු හදවත
# සුවකිරීම

# බිඳුණු හදවත සුවකිරීම

## දෙවියන්වහන්සේගේ වචනයේ බලය කරණකොටගෙන ප්‍රතිෂ්ඨාපනය අත් දැකීම

ජොයිස් මේය
විසිනි

JOYCE MEYER MINISTRIES®

No. 125, St. Joseph’s Street, Grandpass, Colombo - 14

Unless otherwise indicated, all Scripture quotations are taken from the *The Amplified Bible* (AMP). *The Amplified Bible, Old Testament* copyright © 1965, 1987 by The Zondervan Corporation. *The Amplified New Testament,* copyright © 1954, 1958, 1987 by The Lockman Foundation. Used by permission.

Copyright © 2015 by Joyce Meyer Ministries - Asia

All rights reserved. No part of this publication may be reproduced, distributed, or transmitted in any form or by any means, or stored in a database or retrieval system, without the prior written permission of Joyce Meyer Ministries - Asia.

Joyce Meyer Ministries
No. 125, St. Joseph's Street,
Grandpass, Colombo - 14
T.P. No: 011-2336749
Srilanka

Healing the Brokenhearted - *Sinhala (R1 - 2015)*
*Experience Restoration Through the Power of God's Word.*

**මුද්‍රණය:**

ජොයිස් මේයර් සේවය
125, ශාන්ත ජෝසප් වීදිය,
ග්‍රෑන්ඩ්පාස්, කොළඹ 14.
දුරකථනය: 011-2336749

# පටුන


| | |
|---|---|
| හැඳින්වීම ඃ දෙවියන්වහන්සේගේ වචනය | vii |
| 1. දෙවියන්වහන්සේගේ ප්‍රේමය | 1 |
| 2. ඔබගේ අනාගතයට සහතිකයක් ලැබීම | 11 |
| 3. ක්‍රිස්තුස්වහන්සේ තුළ ඔබගේ ධර්මිෂ්ඨකම හඳුනාගැනීම | 21 |
| 4. ඔබගේ අනාගතයට | 33 |
| නිගමනය | 43 |
| ශුද්ධ ලියවිලි ප්‍රකාශනය | 45 |
| හැඳින්වීමඃ දෙවියන්වහන්සේගේ වචනය | 45 |
| දෙවියන්වහන්සේගේ ප්‍රේමය | 46 |
| ඔබගේ අනාගතය | 51 |
| ක්‍රිස්තුස්වහන්සේ තුළ ඔබගේ ධර්මිෂ්ඨකම | 55 |
| බිය පරාජයකිරීම | 60 |
| නිගමනය | 65 |
| බයිබල් පද පරිශීලනය | 66 |
| කෘතුවරිය පිළිබඳව | 67 |

# හැඳින්වීම :
# දෙවියන්වහන්සේගේ වචනය

❤"උන්වහන්සේගේ ස්වකීය වචනය ඒවා ඔවුන් සුවකොට ඔවුන්ගේ විනාශවලින් මුදා හරින සේක්."

ගීතාවලිය 107:20

දේව වචනය අපව සුවකරමින් අපව මුදවාගන්නේයි එසේම එය අප මෙන්ම අපගේ ජීවිතයද වෙනස් කරන්නේයි.

දෙවියන්වහන්සේගේ වචනය අප වෙනස් කරන්නේයි.

දාවිත් ගීතාවලිය 1:1-3 ලියමින් ප්‍රකාශ කරනුයේ දේව වචනය දිවා රාත්‍රී මෙනෙහි කරන තැනැත්තේ මුල් ඇද පිහිටා ඇති ගසක් බවත් සහ ඔහු කරන සියලු දේ සඵලවන බවත්යි.

මුල් ඇද පිහිටවනවා යන නොසැලී සිටීමයි ඔබට නොසැලී සිටිය හැකි අතර ඔබ සියල්ලෙදී සඵලවත් වන්නේයි එසේ කිරීමට ඇති මාර්ගය වනුයේ දේව වචනය මෙනෙහි කිරීමයි.

වචනය මෙනෙහි කිරීම යන්නෙන් අර්ථවත් කරනුයේ, එය ඔබගේ මනස තුළ පෙරළ පෙරළා සෙවීමත්, ඊට ඇලුම්වීමත්, ඒ පිළිබඳව සිතීම

සහ ඔබ විසින් ඔබටම මුමුණා පැවසීමත්යි දෙවියන්වහන්සේ යොෂුවාටද මේ ආකාරව වචනය මෙනෙහි කරන්නැයි මෙසේ අණ කළ සේක්.

> ❤“මේ ව්‍යාවස්ථා පොත නුඹේ මුඛයෙන් පහ නොවේවා, එහි ලියා තිබෙන සියල්ල කරන්ට බලාගන්නා පිණිස රෑ දවල් ඒ ගැන මෙනෙහි කරපන්න එවිට නුඹේ මාර්ගය සඵල වී නුඹට ශුභ සිද්ධවන්නේයි.”
>
> යොෂුවා 1:8

ද්විතිය කථාව 30:14 පදයෙන් අපට පවසා ඇත්තේ, ❤“නුමුත් ඒ වචනය ලෙස නුඹ කරන පිණිස එය නුඹට ඉතා ළංව නුඹේ මුඛයේද නුඹේ සිතේද තිබේ.”

යෙසායා 55:11 පදයෙන් ස්වාමීන්වහන්සේ මෙසේ අපට පොරොන්දුව ඇතී ❤“මාගේ මුඛයෙන් නික්මෙන මාගේ වචනයත් මා වෙතට හිස්ව හැරී නෑවිත් (නිශ් ප්‍රයෝජනවත් ඵල උපදවීමේ කිසි බලයක් නූපද්දවා).”

2 කොරෙන්ති 3:18 පදයෙන් අපොස්තුළුවර පාවුල් අපට උගන්වනුයේ, දෙවියන්වහන්සේගේ වචනය තුළින් ස්වාමීන්වහන්සේගේ මහිමය දකින බැවින්, අපි පරිරූපනය වන්නෙමු ස්වාමීන්වහන්සේගේ මහිමය දැකීම යනු අප උදෙසා තබා ඇති උන්වහන්සේගේ මහිමයේ සැලසුම දැකීමත් සහ එය විශ්වාස කිරීමත්යි.

අපගේ ජීවිත උදෙසා දෙවියන්වහන්සේට යහපත් මෙන්ම මහිමයේ සැළසුමක් ඇතී උන්වහන්සේ අපට ප්‍රේම කළ උන්වහන්සේගේ අධිකතර ප්‍රේමයෙන් සෑහීමට පත්වන පිණිස දෙවියන්වහන්සේගේ ගැළවීමේ සම්පූර්ණ සැළසුම ක්‍රිස්තුස්වහන්සේව මාර්ගයක් කොටදී ඇති බව එපීස පළමු පරිච්ඡේදය පාවුල් පවසයී.

මින් අර්ථවත් කරනුයේ දෙවියන්වහන්සේ අපට ප්‍රේම කරන බවත් සහ උන්වහන්සේට ඔබ හා ඔබගේ ජීවිතය සම්බන්ධව ඓශ්චර්‍යමත්

මෙන්ම මහිමයේ සැළසුමක් ඇති බවයී එය ඔබ විශ්වාස කර, ප්‍රකාශ කළ යුතුවේ.

දෙවියන්වහන්සේගේ සැළසුම විනාශකර දැමීමට යක්ෂයා උත්සහ කරමින් සිටියී ඔබගේ ඔබගේ ජීවිතය කිසි වටිනාකමක් නැති තත්ත්වයට පත්කිරීමට ඔහු ඔහුගේ සියලු වෙර යොදන්නේයී ඒ මන්ද ? ඒ මන්දයත්, දෙවියන්වහන්සේ ඔබට ප්‍රේමකරන ඉමහත්ව ප්‍රේම කරන බව ඔබ විශ්වාස කිරීම දැකීමට ඔහු අකමැති බැවිනී දේව වචනය නිරතුරුවම ඔබට ඇසීම කරණකොටගෙන ඔබගේ අභ්‍යන්තර ජීවිතයත්, ඔබගේ සිතුවිලි පද්ධතියේ යම් ආකාරයක වෙනසක් සිදුකරන බවත් ඔහු දන්නේයී මෙය ඉටු කරගැනීමට ඔහු අපට ඉඩ නොතබන්නේයී.

මේ කෘතිය මා විසින් ලියන ලද්දේ ද මේ නිසාමයී මෙහි ඔබගේ ජීවිතය වෙනස් කරනු ලබන ශුද්ධ ලියවිලි කොටස් ඇතී එබැවින් එය ඔබගේ වර්තමානයත් අනාගතයත් වෙනස් කරන්නේයී.

බයිබලයට අනුව, දෙවියන්වහන්සේ අප උන්වහන්සේගේ ස්වරූපයෙන් මවා ඇතී (උත්පත්ති 1:27) ඔබගේ ආකල්පමය සහ ඔබගේම අදහස් වෙනස්වීම පිළිබඳව දෙවියන්වහන්සේ පවසන දෙය විශ්වාස කරන්නී මෙසේ ඔබගෙන්ම විමසන්නී “මා පිළිබඳව මා සිතන්නේ කුමක්ද?” “මා පිළිබඳව මාගේ අදහස කුමක්ද?” ඉන්පසු ඔබගෙන් මෙසේද විමසන්නී “දෙවියන්වහන්සේ මා පිළිබඳව සිතනුයේ කුමක්ද? මා පිළිබඳව දෙවියන්වහන්සේගේ අදහස කුමක්ද?”

දෙවියන්වහන්සේ ඔබ පිළිබඳව සිතන සහ උන්වහන්සේගේ අදහස උන්වහන්සේගේ වචනයේ සඳහන් කොට ඇතී මේ කෘතියේ සඳහන්කොට ඇති ශුද්ධ ලියවිලි කොටස් කරණකොටගෙන දෙවියන්වහන්සේ සමඟ එකඟත්වයට පැමිණීමට හැකිවෙනවා මිස ඉන් උන්වහන්සේ සමඟ සතුරුකමක් ඇති නොවන්නේයී සමහරවිට ඔබ ජීවිතය පිළිබඳව ඔබට යක්ෂයා විසින් බොරු පවසා ඇති අතර ඔබ ඒවා පිළිගන්නටද

ඇති නමුත් දැන් දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීමේ කාලය පැමිණ ඇත.

යොහාන් 17:17 පදයෙන් යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ වචනය සත්‍යයයි ප්‍රකාශ කළ අතර යොහාන් 8:32 පදයෙන් සත්‍යය ඔබ නිදහස් කරන බව පවසා ඇති දෙවියන්වහන්සේගේ වචනය පමණක් නොව වචනයේ සත්‍යතාවය ඔබව නිදහස් කරන්නේයි එසේම, යම් පුද්ගලයෙකුගේ පිටස්තර පෙනුම මෙන්ම ස්වභාවයද එය වෙනස් කරන්නේයි මේ නිසා දේව වචනය කියවීම, අධ්‍යනය කිරීම සහ මෙනෙහි කිරීම අත්‍යවශ්‍ය වන අතර එය අප අභ්‍යන්තරයටම කිඳා බැසීමට ඉඩ හැරිය යුතුයි.

ක්‍රිස්තුස්වහන්සේ තුළ ඔබට ආත්ම විශ්වාසයෙන්ද, සම්පූර්ණ ප්‍රීතියෙන්ද, විජයග්‍රහණය කළ අයෙකු ලෙසට, විශ්වාසවන්තව, දෙවියන්වහන්සේගේ මිත්‍රයෙකු ලෙස හා දෙවියන්වහන්සේගේ මුහුණ සොයන කෙනෙකු වීමට හැකියාව ලැබෙන්නේයි.

උන්වහන්සේගේ වචනයෙන් ඔබ පිළිබඳව දෙවියන්වහන්සේ පවසන දේ ඔබ විසින් ඔබටම ප්‍රකාශ කරන්නී ඔබ එසේ ක්‍රියාත්මක වන විට, දෙවියන්වහන්සේ ඔබ ජීවිතය තුළද ක්‍රියා කරන්නට පටන්ගන්නේයි එවිට, ඔබගේ කැඩුණු බිඳුණු සහ තුවාලව ඇති හදවත වෙනස් කරන්නේයි එසේම, දෙවියන්වහන්සේ ප්‍රේමකරන මෙන්ම දෙවියන්වහන්සේට බොහෝසෙයින් ප්‍රේමකරන්නාවූ උන්වහන්සේ විශ්වාසවන්ත මිත්‍රයෙකු වීමේ බියක්ද අපව වෙනස් කරන්නේයි.

යෙසායා 61:1-3 පද කියවන්නෙමු ඛ

> ❤"ස්වාමීන්වහන්සේගේ ආත්මය මා කෙරෙහියඛ මක්නිසාද
> දිළිඳුන්ට ශුභාරංචිය දේශනා කරන්ට ස්වාමීන්වහන්සේ මා
> ආලේප කළ සේක්" බිඳුණු සිත් ඇත්තන් සුව කරන්නටද,

[1]Based on the song, "I Will Change Your Name," words and music by B. J. Butler © Mercy Publishing. Used by Permission.

වහලුන්ට නිදහසත් හිරකාරයන්ට හිරගෙයින් මිදීමත් ප්‍රකාශ කරන්නටද (මාංශික සහ ආත්මික),

ස්වාමීන්වහන්සේගේ කරුණාවේ අවුරුද්ද(අනුග්‍රහයේ අවුරුද්ද) සහ අපේ දෙවියන් වහන්සේගේ පළිග ැනීමේ දවසක් ප්‍රකාශ කරන්ටද, වැලපෙන සියල්ලන් සනසන්නට ද,

සියොන්හී වැලපෙන්නන් පළඳවමින්, අළු වෙනුවට මාලාවකුත් (මල්දම් හෝ නළල්පට) වැළපීම වෙනුවට ප්‍රීතිය (සැනසිල්ල හා ප්‍රීතිය) නැමැතී තෛලයත් ක්ලන්ත සිත් වෙනුවට ප්‍රශංසාව නැමති වස්ත්‍රයත් (අර්ථාන්විත) ඔවුන්ට දෙන්නටද උන්වහන්සේ මා එවූ සේක් මෙසේ කළේ ස්වාමීන්වහන්සේට ගෞරවය ලැබීමට උන්වහන්සේ විසින් හිටෙවුවාවු ධර්මිෂ්ඨකමේ (අභිමානවත්, ශක්තිමත්, මහානුභාවසම්පන්න, අවංක අයවලුන්ට කීර්තියත්, යුක්තියත් සහ දෙවියන්වහන්සේ සමඟ නැඟී සිටීමත්ය) ආලෝන ගස්ය කියා ඔවුන් ගැන කියන ලබන පිණිසයි.

එසේය, දෙවියන්වහන්සේ ඔබව වෙනස් කරන සේක් උන්වහන්සේ ඔබගේ චරිතය වෙනස් කරනසේක් උන්වහන්සේ ඔබගේ ජීවිතය වෙනස් කරන සේක් දෙවියන්වහන්සේ ඔබට ප්‍රේමකරන සේක් ඔබ විශේෂ පුද්ගලයෙකි ඒ ප්‍රේමය ඔබට දැනෙනවාට යක්ෂයා අකමැතියි නමුත් දෙවියන්වහන්සේ ඔබට ප්‍රේමකරන සේක්

ඉදිරි පිටුවලදී, ඔබ ඉගෙනගන්නට යෙදෙනුයේ දෙවියන්වහන්සේගේ ප්‍රේමය පිළිබඳව සහතිකය පමණක් නොව, ඔබගේ අනාගතය පිළිබඳව සහතිකයත්, ඔබගේ ධර්මිෂ්ඨකම පිළිබඳවත් (ක්‍රිස්තුස්වහන්සේ තුළ ඔබ කව්රුන්ද?) සහ දෙවියන්වහන්සේ ඔබ උදෙසා සැලසුම් කර ඇති ඓශ්චර්‍යමත් ජීවිතයේ කොටසක් වන උන්වහන්සේගේ ආශීර්වාදය

සොරාගන්නාවූ බිය පරදවා ජයගන්නේ කෙසේදැයිද මෙහිදි අපි ඉගෙනගන්නේමුවී.

ඔබ ජීවිතය පිළිබඳවවූ දෙවියන්වහන්සේගේ කැමැත්ත සහ අරමුණ සම්පූර්ණකොට මිස නොපැමිණෙන්නාවූ උන්වහන්සේගේ වචනය තව ඉදිරියටත් ඔබ ඉගෙනගැනීමේදී දෙවියන්වහන්සේ ඔබට ආශීර්වාද කරන සේක්වා.

# 1

# දෙවියන්වහන්සේගේ ප්‍රේමය

"නමුත් අපට ප්‍රේම කළාවු තැනැන්වහන්සේ කරණකොටගෙන අපි මේ සියල්ලේදී අතිශයින්ම ජයගන්නෝ නොවමුවී.

මක්නිසාද මරණයටත්, ජීවනයටත්, දූතයන්ටවත්, අධිපතිකම්වලටත්, දැන් පවතින දේවලටවත්, මතු පැමිණෙන දේවලටවත්, පරාක්‍රමවලටවත්, උසටවත්, ගැඹුරටවත්,

අන් කිසි මැවිල්ලකටවත්, අපගේ ස්වාමීවු යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇත්තාවු දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් අප වෙන්කරන්නට නොහැකිවන්නේයැයි ඒකාන්තයෙන්ම කියමී."

රෝම 8:37-39

මේ ජීවිත කාලය තුළදී අපට එරෙහිව නැගී සිටින්නාවු සියලු දෙයින් උන්වහන්සේගේ ජීවිතය පූජාකරන තරම් අපට ප්‍රේම කළා වු ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන අපි අතිශයෙන් ජයග්‍රහණය ලැබීමුවී.

යොහාන් 3:16 පදයෙන් යේසුස්වහන්සේම කථාකරමින් මෙසේ පවසයි, ❤"මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒක ජාතක (අද්වීතීය) පුත්‍රයාණන් දෙන තරම් (එතරම්ම) ලෝකයාට ප්‍රේම කළ සේක් එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්න (විශ්වාසය තබන්නා වූ, එල්ලී සිටින්නා වූ, උන්වහන්සේ මත යැපෙන්නා වූ) සැමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසයි."

ලෝකයේ ජීවත්වන එකම පුද්ගලයා ඔබ පමණක්ම වුවද, පුද්ගලිකවම ඔබට යේසුස්වහන්සේ ප්‍රේමකරන සේක්.

ප්‍රේමණීය අපොස්තුළුවර යොහාන් අපට මෙසේ පවසයි, ❤"ප්‍රේමයෙහි (භය උපදවනසේ පවතින්නේ නැත) භය ඇත්තේ නැත සම්පූර්ණ ප්‍රේමය (පූර්ණ, පරිපූර්ණ) භය දුරු කරයි. මක්නිසාද (එබැවින්) භය දඬුවමින් යුක්තිය ඞ භයවන තැනැත්තේ ප්‍රේමයෙහි සම්පූර්ණ නොවී සිටියි (පරිපූර්ණ ප්‍රේමයට තවමත් වර්ධනය වී නැත)" (1යොහාන් 4:18).

අපගේ හදවත්වල භය ඇත්තේ නම්, එය, දෙවියන්වහන්සේගේ ප්‍රේමය පිළිබඳව අපට හරිහැටි දැනුමක් නොමැතිකම දැක්වීමේ ලකුණක්වේ.

දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ විශාලත්වය ඔබ දන්නේ නම්, එය ඔබ තුළ ඇති බිය පහකිරීමේලා සාධකයක් වන්නේයි

යොහාන් 16:27 පදයෙන් යේසුස්වහන්සේ මෙසේ පවසයි, ❤ "මක්නිසාද නුඹලා මට ප්‍රේම වූ බැවින්ද මා දෙවියන්වහන්සේ වෙතින් ආ බව විශ්වාස කළ බැවින්ද පියාණන්වහන්සේම නුඹලාට ප්‍රේමවන (කරුණාවෙන් පූර්ණව) සේක්."

දෙවියන්වහන්සේ ඔබට මෙතරම්ම ප්‍රේමකරන බව විශ්වාස කිරීමට ඔබට අසීරුද?

උන්වහන්සේගේ ප්‍රේමය ලැබීමට තරම් මා සුදුසු නැති බවට මා කල්පනා කළ බැවින්, අවුරුදු ගණනාවක් පුරාවටම දෙවියන්වහන්සේගේ ප්‍රේමය ලබාගැනීමට නොහැකි වියි නුමුත් දැන් මෙතෙක් මා අසම්පූර්ණව සිටියත් උන්වහන්සේ මට ප්‍රේම කරන බව දනිමි.

යොහාන් 14:21 පදයෙන් යේසුස්වහන්සේ අපට මෙසේ යමක් මතක්කරදී දෙයී ❤"යමෙක් මාගේ ආඥා පිළිගෙන රක්‍ෂා කෙරේද, මට ප්‍රේමකරන්නේ (සැබවින්ම) ඔහුයී මට ප්‍රේම කරන්නා (සැබවින්ම) මාගේ පියාණන් විසින් ප්‍රේමකරනු ලබන්නේයී මමද (මමත්) ඔහුට ප්‍රේම කොට ඔහුට (එළිදරව් වී, ප්‍රත්‍යක්‍ෂව) ප්‍රකාශ වන්නෙමියි කී සේක් (ඔහුට මා පැහැදිලිව දැක ගැනීමට සලස්වමින් මමම ඔහු ඉදිරියෙහි සිටින්නෙමී)."

ඔබ ඉදිරියේ යේසුස්වහන්සේට සැබවින්ම ප්‍රකාශවීමට අවශ්‍යයයී.

කීකරුකම, සැබෑ ප්‍රේමයෙහි ඵලයකී නමුත් මූලිකවම ඔබ දෙවියන්වහන්සේගේ ප්‍රේමය නොලැබ කීකරුකමෙන් උන්වහන්සේට ප්‍රේම කිරීමට නොහැකියී ඔබට එය උපයා ගැනීමට නොහැකී ඔබගේ යහපත් හැසිරීමෙන් හෝ යහපත් ක්‍රියාවලින් එය මිළදීගත නොහැකී.

දෙවියන්වහන්සේගේ ප්‍රේමය නොමීළේවු ත්‍යාගයකිඩ එය කොන්දෙසි විරහිතයී අප වෙනුවෙන් කුරුසියෙදී දිවි පිදූ යේසුස්වහන්සේ කරණකොටගෙන එය අප වෙතට පැමිණෙන්නේයී.

දෙවියන්වහන්සේගේ ප්‍රේමය මේ දැන්ම ලබන්නී උන්වහන්සේ අභිමුඛයේ ඉඳිමින් මෙසේ පවසන්න "ස්වාමීනි ඔබ මට ප්‍රේමකරන බව මම විශ්වාස කරමි, මම ඔබගේ ප්‍රේමය ලබන්නෙමී."

1 යොහන් 4:19 මේ දක්වා ඇතී ❤"අප ප්‍රේම කරන්නේ උන්වහන්සේ පළමු කොට අපට ප්‍රේම කළ නිසායී" සමහර විට ඔබද, මා අවුරුදු ගණනක් කළාමෙන් ඔබ ආපස්සට යනවා විය හැකී ඔබ සමහරවිට බෙහෙවින්ම දෙවියන්වහන්සේට ප්‍රේම කරමින්, උන්වහන්සේද ඔබට ප්‍රති ප්‍රේමය දක්වයි යැයි අදහසින් ප්‍රේමකිරීමට උත්සහ දරනවා විය හැකී නමුත්, 1 යොහන් 4:19 දෙස බලන්නී ❤"අප ප්‍රේම කරන්නේ උන්වහන්සේ පළමුකොට අපට ප්‍රේම කළ නිසායී."

ගීතාවලිය 36:7 පදයෙන් දෙවියන්වහන්සේගේ ප්‍රේමය පිළිබඳව ආ ද්‍රාවිත් තුළ වූ මහත් විශ්වාසය දක්වා ඇතී ❤"දෙවියන්වහන්සේ, ඔබගේ කරුණාගුණය කොපමණ අනර්ඝද ණී මනුෂ්‍ය පුත්‍රයෝ ඔබගේ පියාපත් සෙවණෙහී ආරක්‍ෂාව ලබතී."

ගීතාවලිය 139 පද කිහිපයක් ඔබ සමග' බෙදාගැනීමට කැමැත්තෙමි ද්‍රාවිත් දෙවියන්වහන්සේ සමඟ සන්නිවේදනයේ යෙදුණේ ඔහුටම අවේනිකවූ අද්විතීයවූ මාර්ගයකී ඔහුගේ ඒ ආදර්ශය අපටද අනුගමනය කිරීම යහපත්වේ ගීතාවලිය 139 පහත දැක්වෙන පද ඔබගේ මුඛයෙන් ප්‍රකාශ කරන්නී.

> ❤"ස්වාමීනි, ඔබ මා විමසා බලා දැනගත්සේකී ඔබ මාගේ හිඳීමද නැඟිටීමද දන්නා සේකී දුරදීම මාගේ සිතිවිල්ල ඔබට තේරෙයී ඔබ මාගේ සයනයත් විමසා බලන සේකී මාගේ සියලු මාර්ග දැනගෙන සිටින සේකී මක්නිසාද, ස්වාමීනි, ඔබ මුළුමනින්ම නොදන්නාවූ කිසි වචනයක් මාගේ දිවේ නැත්තේයී ඉදිරියෙන්ද පස්සෙන්ද ඔබ මා වටකරමින්, ඔබගේ හස්තය මා පිට තැබූ සේකී මෙවැනි ඥානයකින් මට අතිශයින් පුදුමයඬ එය උසස්ය, ඊට ළඟාවෙන්ට නොහැක්කේයී ඔබගේ ආත්මය කෙරෙන් කොතැනට යන්නේම්ද? ඔබ ඉදිරියෙන් කොතැනට පලායම්ද?
>
> දෙවියන්වහන්ස, ඔබගේ සිතුවිලි මට කොපමණ අනර්සදණී ඒවායේ ගණන කොපමණ මහත්දණී.
>
> ඒවා ගණන්නේ නම් වැලිවලටත් වැඩියී මම පිබිදෙන විටත් ඔබ සමඟ වෙමී.
>
> ගීතාවලිය 139:1-7, 17,18

මෙය බලසම්පන්නයි ණී!

අපට යහපත කරන පිණිස දෙවියන්වහන්සේ බලා සිටින බව යෙසායා ප්‍රොපේතවරයා යන පවසයී ❤"එබැවින් ස්වාමීන්වහන්සේ නුඹලාට කරුණා කරන්ට (බලාපොරොත්තුවෙන් දැඩි ආශාවෙන් සහ අභිලාෂයෙන්) බලා සිටින සේකී නුඹලාට අනුකම්පා කරන්ට නැඟිටින සේකී මක්නිසාද ස්වාමීන්වහන්සේ විනිශ්චයේ දෙවි කෙනෙක්යඬ උන්වහන්සේ ගැන බලා සිටින (මහත් උනන්දුවකින්) සියල්ලෝම වාසනාවන්තයෝයී (ප්‍රීතිමත්,

භාග්‍යවත්, අන් අයවලුන් ඊර්ෂ්‍යා කරනු ලැබීමී. (උන්වහන්සේගෙන්වූ ජයග්‍රහණය උදෙසා, උන්වහන්සේගේ ප්‍රීතිය, සහ සමකළ නොහැකි හා නොබිඳුණු උන්වහන්සේගේ මිත්‍රත්වයයී) (යෙසායා 30:18).

දෙවියන්වහන්සේ ඔබට ප්‍රේමකරන නිසාත්, හා ඔබ උන්වහන්සේට විශේෂ නිසාත් ඔබත් සමඟ යම් කාලයක් ගතකිරීමට උන්වහන්සේට අවශ්‍යයී මේ පිළිබඳව සිතන්නී.

ඔබගේ සෑම මුළාව යාමක්ම ගණන් කරමින් වාර්තා කරගනුයේ ඔබට දෙවියන්වහන්සේ එතරම්ම ප්‍රේමකරන බැවිනී උන්වහන්සේ ඔබගේ කඳුළු භාජනයකට දමා, උන්වහන්සේගේ පොතේ ලියාගන්නා සේකී (ගීතාවලිය 56:8).

යොහන් 14:18 පදයෙන් යේසුස්වහන්සේ තම ගෝලයන්ට මෙසේ පැවසූ සේකී ❤"නුඹලා අනාථව (සුවපහසුව නැති, හුදකලාව, වියෝවට පත්ව, අපේක්ෂා භංගව, අසරණව) නාරින්නෙමි නුඹලා වෙතට (නැවත) එමී."

ගීතාවලිය 27:10 පදයෙන් දාවිත් මෙසේ ලියා ඇතී ❤"මාගේ පියාද මවුද මා අත්හැරියෝය, නමුත් ස්වාමීන්වහන්සේ මා (උන්වහන්සේගේ දරුවකුසේ මා හඳුනාගන්නා සේකී) පිළිගන්නා සේකී."

සෑම තැනැත්තෙකුම කමැති සහ සොයන්නාවූ ස්වභාවික ප්‍රේමය සමහරවිට ඔබට ලැබෙනුයේ මද වශයෙන් විය හැකී සමහරවිට ඔබගේම පවුලද ඔබව අත්හැර දමා ඇතී ඔබ වෙනුවෙන්වූ දෙවියන්වහන්සේගේ ප්‍රේමය ඉතා ශක්තිමත් බවත්, ප්‍රබල බවත් සහ බලවත් බවත් ඔබ අද දවසේ දැනගන්නවා ඇතී ඒ ප්‍රේමය වෙනත් ඕනෑම කෙනෙකුගේ ප්‍රේමය පසුකර ඉහළින්මවූ ප්‍රේමයකී ඔබව සනසවන්නට සහ ඔබගේ කැඩුණු බිඳුණු හදවත සුව කරන්නට උන්වහන්සේට ඉඩහරින්නී.

දෙවියන්වහන්සේගේ පවුලේ දරුවෙකු බවට පත්කරගෙන ඇතී ඔබ උන්වහන්සේගේ දරුවෙක් වන අතර උන්වහන්සේ ඔබට ප්‍රේමකරන සේකී.

ඔබ සහ මා පිළිබඳව අපොස්තුළුවරයා එපීස 3:17-19 පදවලට යාච්ඤා කළේයිඃ

> ❤"(ඒකාන්තයෙන්ම) ඇදහිල්ල කරණකොටගෙන ක්‍රිස්තුස්වහන්සේ නුඹලාගේ සිත් තුළ වාසය (පදිංචිවීම, බද්ධවී'ම, ස්ථිර වාසස්ථානය කරගැනීම) කරන පිණිසත්, නුඹලා ප්‍රේමයෙහි මුල් ඇද පිහිටා සිට.
>
> දෙවියන්වහන්සේගේ මුළු පූර්ණකමට (දිව්‍යමය අභිමුඛයේ පූර්ණ පොහෝසත්කමට අනුව සහ මුළු ශරීරයම පිරී සහ උතුරායන අයුරින් දෙවියන්වහන්සේම ඔබ තුළ වාසය කිරීම) පූර්ණ වන (ඔබගේ මුළු ජීවිතයම) පිණිස සියලු ශුද්ධවන්තයන් (දෙවියන්වහන්සේට කැපවුණු, උන්වහන්සේගේ ප්‍රේමය අත් වින්දාවූ) සමඟ (එහි) ක්‍රිස්තුස්වහන්සේගේ දැනගත නොහැකි ප්‍රේමය දැනගෙන (අත් දැකීමක් නොමැතිව).
>
> එහි පළල, දිග, උස, ගැඹුර කිමෙක්ද කියා තේරුම්ග ැන්ට (සැබවින්ම ඔබ පැමිණෙන්නේය) නුඹලාට පුළුවන් වන (ප්‍රායෝගිකව, ඔබගේ ඇත්දැකීම තුළින්) පිණිසත්, උන්වහන්සේගේ මහිමයේ සම්පතේ හැටියට නුඹලාට දෙන මෙන් යාච්ඤා කරමි."

එසේය, දෙවියන්වහන්සේ ඔබට ප්‍රේම කරන අතර උන්වහන්සේ ඔබ පිළිබඳව සොයා බලන සේකී සැමවිටම උන්වහන්සේ ඔබ කෙරෙහි නෙත් යොමා සිටින සේකී යෙසායා 49:16 පදයෙන් අපගේ පින්තූරයක් උන්වහන්සේ සතුව ඇති බවත් සහ උන්වහන්සේගේ අත්ලේ රූප කොටාගෙන ඇති බවත් සඳහන්වේ.

යොහන් 15:9 පදයේ යේසුස්වහන්සේ මෙසේ පවසා ඇතී ❤"පියාණන්වහන්සේ මට ප්‍රේමකළාක් මෙන්ම මමත් නුඹලාට ප්‍රේම කෙළෙමි මාගේ ප්‍රේමයෙහී පැවතියල්ලා."

දෙවියන්වහන්සේට ඔබට කොතරම් ප්‍රේම කරන්නේද?

❤"යමෙක් තමාගේ මිත්‍රයන් උදෙසා තමාගේ ජීවිතය දීමට වඩා මහත් ප්‍රේමයක් (එවැනි ශක්තිමත් ස්නෙහයක් කිසිවෙකු ළග නැති) කිසිවෙකුට නැති." (යොහන් 15:13)

ඒ ආකාරව ඔබට ප්‍රේම කරන්ට වෙන කිසිවෙකු ළග ඒ ප්‍රේමය ඉක්මවා යන විශිෂ්ඨවු ප්‍රේමයක් තවත් නැති.

යේසුස්වහන්සේට ඔබ මිත්‍රයෙකුවීම අවශ්‍යයි.

රෝම 5:6 පදයෙන් පවුල් මට මෙසේ මතක් කර දෙයි ❤"මක්නිසාද අප දුර්වලව (අප විසින් අපටම උපකාර කරගැනීමට බලයක් නොමැතිව) සිටියදීම නියම කාලයේදී ක්‍රිස්තුස්වහන්සේ අභක්තිකයන් (වෙනුවෙන්) උදෙසා මළ සේක."

අප පව්කරුවන්ව සිටියදීම, දෙවියන්වහන්සේගේ මහත් ප්‍රේමය පෙන්වන පිණිස අප වෙනුවෙන් දිවි පිදීම පිණිස උන්වහන්සේ යේසුස්වහන්සේව නිසි කාලයේදි එව් සේක.

ඉන්පසු 7 වන පදයෙන් තවදුරටත් පාවුල් පවසනුයේ, ❤"ධර්මිෂ්ඨයකු උදෙසා යමෙකු මැරෙන්ට කැමැතිවීම දුර්ලභයි සමහරවිට සත් පුරුෂයා උදෙසා මැරෙන්ට යමෙකු ධෛර්‍යය ඇතුව සිටින්ට පුළුවනි."

පාවුල් තම කථාව අවසන කරමින් 8 පදයෙන් මෙසේ පවසයි ❤"නුමුත් දෙවියන්වහන්සේ අප කෙරෙහි ඇති තමන්වහන්සේගේ (තමන්වහන්සේගේම) ප්‍රේමය පෙන්වන්නේ අප පව්කාරයන්ව සිටියදීම අප වෙනුවට ක්‍රිස්තුස්වහන්සේ (මෙසියස්වහන්සේ, ආලේපලත් තැනැන්වහන්සේ) මරණය විඳීමෙන්යි."

මාගේ ප්‍රේමවන්තය, දෙවියන්වහන්සේ ඔබට බෙහෙවීන්ම ප්‍රේමකරන සේක් දෙවියන්වහන්සේගේ ප්‍රේමය ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් ඔබට එළිදරව් කරන සේක් ඔබගේ හදවත විවෘත කර දෙවියන්වහන්සේගේ ප්‍රේමය ලබන්නී ඔබ කොතැනක සිටියත් දෙවියන්වහන්සේ ඔබව පිළිග න්නා සේක් උන්වහන්සේ ඔබව කිසිදා හෝ ප්‍රතික්ෂේප නොකර අතර ද්‍රෝෂාරෝපනයටද පත් නොකරන සේක් (යොහන් 3:18).

එපීස 1:6 පදයෙන් දෙවියන්වහන්සේගේ ප්‍රේමණීය ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේ පිළිගන්නා තත්ත්වයට අපව පත්කළ බව පාවුල් පවසා ඇති අපගේම හැකියාවෙන් පරිපූර්ණවීම කරණකොටගෙන අපව පිළිගන්නේ නැති.

පියාණන් ඉදිරියේ පෙනී සිටිය හැකි ප්‍රමාණවත් ධර්මිෂ්ඨකම අපට හිමිවනුයේ ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙනවූ ධර්මිෂ්ඨකමෙනී.

❤"උන්වහන්සේගේ කරුණාවේ සම්පතේ ප්‍රමාණයටී" යනුවෙනී එපීස 1:7 පදය දක්වයී එසේම එහි තවදුරටත් " "උන්වහන්සේගේ ලේ කරණකොටගෙන අපේ මිදීම වන අපේ වැරදිවලට කමාව අපට ඇත්තේයී."

සහ යෙසායා 54:10 පදයෙන් අපට මෙසේ පවසා ඇතී ❤"හෙල්ද සොලවනු ලබන්නේයධ නුමුත් මාගේ කරුණාව නම් නුඹෙන් පහ නොවන්නේයී, මාගේ සමාදාන ගිවිසුමද සොලවනු නොලබන්නේයයි නුඹට අනුකම්පා කරන ස්වාමීන්වහන්සේ කියන සේකී."

පාවුල් තුමා අපට 1 කොරෙන්ති 1:9 පදයෙන්, ❤"දෙවියන්වහන්සේ විශ්වාසව (අචල, විශ්වාසනීය, එබැවින් තමන් පොරොන්දු ඉෂ්ඨ කරන අතර උන්වහන්සේ මතු යැපීමට හැකිය) සිටින සේකී" ඔබ විසින් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි විශ්වාසය තබන තුරාවටම, දෙවියන්වහන්සේ ඔබව ප්‍රතික්ෂේප නොකරන බවට උන්වහන්සේ පොරොන්දුව සිටින සේකී එසේම, උන්වහන්සේ අපට ප්‍රේම කිරීමටත්, සහ පොරොන්දු ඉටු කරන බවටත් පොරොන්දුව ඇතී.

ඔබව උන්වහන්සේට අයිති බැවින්, උන්වහන්සේ ඔබ උදෙසාද යාච්ඤා කරන බව යොහන් 17:9, 10 පදවලින් පවසා ඇතී දෙවියන්වහන්සේ විසින් ඔබව උන්වහන්සේට භාරදී ඇති අතර උන්වහන්සේ ඔබ තුළ මහිමයට පත්ව ඇතී

දෙවියන්වහන්සේ ඔබට ප්‍රේම කරන සේකී ඒ ප්‍රේමය ලබාගන්නී.

දාවිත් සමඟ ඔබද ප්‍රකාශ කරන්නධ.

❤"මාගේ ආත්මය ස්වාමීන්ට ප්‍රශංසා (ස්නෙහයෙන්,

කෘතඥපූර්වකව) කරව් මා තුළ ඇති සියල්ල (ගැඹුරෙහිම ඇති) උන්වහන්සේගේ ශුද්ධවූ සාමයට ප්‍රශංසා කරව්

මාගේ ආත්මය, ස්වාමීන්ට ප්‍රශංසා (සෙනෙහයෙන් කෘතඥපූර්වකව) කරව, උන්වහන්සේගේ උපකාර සියල්ල (එකක්වත් නැර) සිහි නැති නොකරව,

උන්වහන්සේ තාගේ සියලු (සෑම එකක්ම) අයුතුකම් කමා කරන සේක්‍ තාගේ සියලු රෝග (එකිනෙක) සුව කරන සේක්‍ තාගේ ජීවිතය විනාශයෙන් මුදා කරුණා ගුණය හා දයාව නැමැති ඔටුන්නෙන් තා සරසන සේකී"

ගීතාවලිය 103:1-4

ජීවමාන බයිබලයේ අනුවාදයට අනුව දාවිත් විසින් 5, 6, 8, 11-13, 17 යන පද මෙසේ ප්‍රකාශ කර ඇතී.

❤"රාජාලියෙකු මෙන් තාගේ යෞවනකම අලුත්වන පිණිස උන්වහන්සේ තාගේ කට යහපත් දෙයින් තෘප්තියට පමුණුවන සේකී ස්වාමීන්වහන්සේ පීඩා විඳින සියල්ලන් උදෙසා ධර්මිෂ්ඨ ක්‍රියා හා යුක්තිය ඉෂ්ඨ කරන සේකී ස්වාමීන්වහන්සේ අනුකම්පාවෙන් හා දයාවෙන් පිරී සිටින සේක,

කෝපවීමට ප්‍රමාදයයී අතිශයින් කරුණාවන්තයී මක්නිසාද පොළොවට උඩින් අහස උස්ව තිබෙන්නාක්මෙන් උන්වහන්සේ කෙරෙහි භය ඇත්තන්ට උන්වහන්සේගේ කරුණාව මහත්යී නැගෙනහිර බස්නාහිරෙන් දුරව තිබෙන්නාක්මෙන් උන්වහන්සේ අපේ වරද අපෙන් දුරු කළ සේකී පියෙක් තම දරුවන්ට අනුකම්පා කරන්නාක්මෙන් ස්වාමීන්වහන්සේ තමන් කෙරෙහි භය ඇත්තන්ට අනුකම්පා කරන සේකී නුමුත් ස්වාමීන්වහන්සේගේ කරුණාව තමන්ට භය ඇත්තන් කෙරෙහි සදාකාලයෙන් සදාකාලයටද, උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම දරුවන්ගේ දරුවන්ටද පවත්නේයී."

නැවත වරක් දාවිත් ගීතාවලිය 32:10 පදයෙන් මෙසේ පවසයි ❤"නමුත් ස්වාමීන්වහන්සේ කෙරෙහි විශ්වාසය කරන තැනැත්තේ කරුණාවෙන් වටකරනු ලබන්නේයි" එසේම ගීතාවලිය 34:1-8 පදවල ඔහු මෙසේ ලියා ඇති.

> ❤"සැමකල්හීම ස්වාමීන්ට ප්‍රශංසා කරමී උන්වහන්සේගේ වර්ණනාව මාගේ මුඛයේ නිතරම පවත්නේයි මාගේ ආත්මය ස්වාමීන්ගේ ගුණ වර්ණා කරන්නේයි යටහත් සිත් ඇත්තෝ ඒ අසා සන්තෝෂවන්නෝයි මා සමඟ ස්වාමීන් වර්ණනාකරව්, අපි එක්ව උන්වහන්සේගේ නාමය උසස් කරමු.
>
> ස්වාමීන් සෙවීමි, උන්වහන්සේ මට උපකාරදී, මාගේ සියලු භයින් මා මිදූ සේකී ඔව්හු උන්වහන්සේ දෙස බලා එළිය ලැබුවෝයි ඔවුන්ගේ මුහුණු කිසි කලෙකත් ලැජ්ජා නොවන්නේයි මේ දුප්පතා මොරගැසුවේය□ ස්වාමීන්වහන්සේ ඔහුගේ බස් අසා ඔහුගේ සියලු දුක්වලින් ඔහු ගැළවූ සේකී ස්වාමීන්ගේ දූතයා උන්වහන්සේට භය ඇත්තන් හාත්පස කඳවුරු බැඳ ඔවුන් මුදා හරියි.
>
> ස්වාමීන් යහපත් බව රස බලා දැනගනිව් උන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන මනුෂ්‍යයා ආශීර්වාද ලද්දේයි."

ප්‍රේමය පව් රාශියක් වසන බව පේත්‍රුස් අපට පවසයි (1 පේත්‍රුස්4:8) දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් ඔබව ආවරණයකර ඇති ජීවත්වන්නේ ඒ ආවරණය තුළයි ඔබත් ජීවනයට ඒ මගින් ආශීර්වාද කරන්නට ඉඩහරින්නී දවසක් තුළ බොහෝ අවස්ථාවලදී නැවත නැවත "දෙවියන්වහන්සේ ඔබට ප්‍රේමකරන" බව ප්‍රකාශ කරන්නී

මේ පරිච්ඡේදයේ දක්වා ඇති ශුද්ධ ලියවිලි මෙනෙහි කරන්නී උන්වහන්සේ අපට දානය කිරීමට කැමැත්තෙන් සිටින ඒ ප්‍රේමයේ, බහුලත්වයේ සහතිකයක් සහ ඒකාබද්ධවූ ප්‍රේමයත් ස්වාමීන්වහන්සේගෙන් ලබන පිණිසවූ ඔබගේ කොටස වනුයේ කීකරුකමයි.

# 2

# ඔබගේ අනාගතයට සහතිකයක් ලැබීම

දෙවියන්වහන්සේ විසින් අප උදෙසා සැළසුම් කරන ලද විශිෂ්ඨවත් අනාගතය පිළිබඳව දක්වා ඇති ශුද්ධ ලියවිලි ඔබ සමග බෙදාගැනීමට කැමැත්තෙමි ඔබ වටිනා පුද්ගලයෙකු බව ඔබ දැනගැනීම මට අවශ්‍ය වන අතර ඔබව මැවීමේදී දෙවියන්වහන්සේට ඔබ පිළිබඳව විශේෂ අරමුණු උන්වහන්සේගේ මනසේ තිබිණි

“මටම වු දෛවයක් (ඉරණම් සැළසුමක්) ඇත” (ෂ ය්ඩැ ᑊ ꬾැඵසබහ) යනුවෙන් නම් තබන ලද ගීතයේ පද රසිකයා මෙසේ දක්වා ඇති මට හිමි දෛවය උන්වහන්සේ විසින් පුරවනු ලබන බව මම දන්නෙමි එය දෙවියන්වහන්සේ විසින් පෙර නියම කරන ලද අතර, දෙවියන්වහන්සේ විසින්ම ඔහු තෝරාගෙන ඇති බවත්, ශුද්ධාත්මයාණන්වහන්සේ කරණකොටගෙන උන්වහන්සේ ඔහු තුළ බලයෙන් යුතුව ක්‍රියාත්මකව සිටින බවද පැවසුවේයි මහත් උනන්දුවක් ඇති කරන ප්‍රකාශනයකින් එය මෙසේ නිමකර ඇති “මටමවු දෛවයක් ඇති මා උපත ලැබුවේ හිස් පැතුමක් සමඟ නොව, එවැනි කාලයක් සඳහා නොව, එවැනි කාලයක් සඳහා නොවී”[1]

---

ꬾදදඵ බදඵැ ඦ
[1]පදමාලාව සහ සංගීතය මාර්ක් අල්ට්‍රොග් (ජ) 1985
ඡැදවකැ දෙ ꬾීබඵ ɤසකක ප්ජසප්ජ

ඔබ සිතනුයේ කෙසේද? ඔබගේ අනාගතය දැක්ම කවර ආකාරයද?

අප පූර්ණ බලාපොරොත්තුවකින් යුතුව ජීවත්වීම දෙවියන්වහන්සේගේ අවශ්‍යතාවයයි නමුත් යක්ෂයාට අවශ්‍ය අප බලාපොරොත්තු රහිතව ජීවත්වීමයි සෑම දිනකම ඔබගේ ජීවිතයට යහපත් දේ සිදුවීම ඔබ විසින් අපේක්ෂා කිරීම දෙවියන්වහන්සේට අවශ්‍යවේ නමුත් ඔහුගේ අරමුණ ඔබව වරදට පත්කිරීමත්, සහ ඔබව වනසා දැමීමටත්යි.

හිතෝපදේශ කතෘ, එහි 15:15 පදයෙන් මෙසේ පවසයි ❤"දුක්ඛිතයාගේ සියලුම දවස් නරකය කාංසා සිතුවිලි සහ අනතුරු පිළිබඳවවු පූර්ව නිමිති සිත්හි තබාගැනීම)ඩ එහෙත් සතුටු සිත නිරන්තරයෙන්ම මංගල්‍යයක්යි" (පවතින තත්ත්වය නොසලකා).

ගීතාවලිය 27:13 පදයෙන් දාවිත් මෙසේ ලියයි, ❤"ජීවතුන්ගේ දේශයෙහි ස්වාමීන්ගේ යහපත්කම දකින්ට ලැබේයයි නොඇදහුවෙම් නම් කොපමණ අසරණද? (මා කවර ආකාර තත්ත්වයකට පත්වේද?) ඔහු ඊළඟ පදයෙන් තව තවත් උනන්දු කරවමින්," "ස්වාමීන් කෙරෙහි බලා සිටුවී ශක්තිමත් වෙව, තාගේ සිත ධෛර්‍යමත් වේවාඩ එසේය, ස්වාමීන් කෙරෙහි බලාසිටුව" යනුවෙන් පවසයි.

යෙරමියා 29:11 පදයෙන් ස්වාමීන්වහන්සේ තමන්ගේ අරමුණ අප උදෙසා එළිදරව් කරයි ❤"මා විසින් නුඹලා ගැන කරන යොජනා මමම දනිමි, නුඹලාට මතු කාලයේදී බලාපොරොත්තුවක් දීමට ඒවා විපත්තියේ නොව සමාදානයේ යොජනා යයි ස්වාමීන්වහන්සේ කියන සේක්."

යක්ෂයාට අවශ්‍ය ඔබව නිරපේක්ෂකත්වයට පත්කිරීමටයි ඔබව නිරපේක්ෂකව දකින්නත්, නිරපේක්ෂිතව සිතන අයුරු දකින්ටත් නිරපේක්ෂිතව කථාකිරීම දකින්නත් සහ නිරපේක්ෂිතව ක්‍රියාකිරීම දැකීමත් ඔහුට අවශ්‍යව ඇති බව මතක තබාගන්නී.

නමුත්, ගීතාවලිය 42:11 පදයේ සඳහන් දාවිත් විසින් ලියන ලද බලවත් වචනවලට ඇහුම්කන් දෙන්නී ❤"එම්බා මාගේ ආත්මය, මක්නිසාද මලානිකව ඉන්නේහිද? මක්නිසා මා තුළ කැළඹෙන්හිද? දෙවියන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තු වෙවඩ මක්නිසාද මාගේ මුහුණේ සැපදායකවු

මාගේ මුහුණේ සැපදායකවූ මාගේ දෙවිවූ උන්වහන්සේට තවම ස්තුති ප්‍රශංසා කරන්නෙමි.”

මෙවැනි ශුද්ධවූ ලියවිලි කොටස් ඔබගේ හදවතේහී සඟවාගැනීම තුළින් බලාපොරොත්තුවේ පූර්ණත්වයෙන් සහ සම්පූර්ණ ප්‍රීතියෙන් යුතුවූ අපේක්ෂාවන්වලින් පුරවා ගතහැකියි එවිට ඔබව බලාපොරොත්තු සහිතව දකින්නටද, ඔබට බලාපොරොත්තුද සහිතව සිතන්නටද, බලාපොරොත්තු සහිතව කථාකරන්නටද සහ බලාපොරොත්තු සහිතව ක්‍රියාකරන්නටද හැකිවන්නේයී.

අපොස්තුළුවර පාවුල් රෝම 5:5 පදයෙන් අපට මෙසේ පවසයී ❤“බලාපොරොත්තු ලැජ්ජාවට නොපමුණුවන්නේයඛ මක්නිසාද අපට දෙන ලද ශුද්ධාත්මයාණන්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේගේ ප්‍රේමය අපගේ හෘදවල වගුරුවන ලද්දේයි.”

වෙනත් වචනයකින් පවසතොත්, ශුද්ධාත්මයාණන්වහන්සේ අපට එය අපට උගන්වන බැවින් දෙවියන්වහන්සේගේ ප්‍රේමය අපි දන්නෙමු් උන්වහන්සේ අපට ප්‍රේම කරන බවත් සහ අප වෙනුවෙන් මහත් සැළසුමක් තබා ඇති බැවිනුත්, දෙවියන්වහන්සේ තුළ අපට මහත් බලාපොරොත්තුවක් තැබිය හැකියි අපගේ සියලු බලාපොරොත්තු සහ අපේක්ෂාවන් උන්වහන්සේ තුළ තබන විට කිසිදා අපි කණගාටුවට පත්වන්නේවත්, මුළාවන්නෙවත් හෝ ලජ්ජාවට පත්වන්නෙවත් නැතී.

ගීතාවලිය 84:11 මෙසේ පවසය, ❤“මක්නිසාද දෙවිවූ ස්වාමීන්වහන්සේ සූර්යයෙක්ය, පළිහක්යි ස්වාමීන්වහන්සේ අනුග්‍රහයත් මහිමයත් දෙන සේකී අවංක ලෙස හැසිරෙන්නන් ගෙන් කිසි යහපතක් නොවලක්වන සේකී.”

පිලිප්පි 1:6 පදයෙන් පාවුල් අපට සහතිකයක් දෙයී, ❤“නුඔලා තුළ යහපත් වැඩක් පටන්ගත් උන්වහන්සේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දවස (උන්වහන්සේගේ පැමිණීමේ නිශ්චිතම වේලාව දක්වා) දක්වා ඒක සම්පූර්ණ කරන සේකැයි (දෙවියන්වහන්සේගේ කාර්යයන්) යන මේ විශ්වාසය ඇතුව සිටිමී.”

එපිස 2:10 පදයෙන්, මේ මහත් සහතිකය පිළිබඳවවූ හේතු මෙසේ විස්තර කරයිඃ

> ❤"මක්නිසාද අපි වනාහී යහපත් ක්‍රියා කරන පිණිස ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ මවනු (අළුතින් ඉපද) ලැබ දෙවියන්වහන්සේගේ (තමන්වහන්සේගේම) කර්මාන්තයව (උන්වහන්සේගේ නිර්මානයක්ව) සිටිමුව් ඒ යහපත් ක්‍රියාවල (පෙර නියමකළ පරිදි අපට ජීවත්වීමට සූදානම්කර තැබීම) අප හැසිරෙන පිණිස දෙවියන්වහන්සේ ඒවා කලින් (මැවීමට පෙර) සූදානම් කළ සේක්" (කළින්ම සූදානම් කළ).

දැන් ඔබ ඔබගෙන්ම මෙසේ අසන්නී "මා වෙනුවෙන් එවැනි සැලසුමක් දෙවියන්වහන්සේ විසින් තබා ඇත්තේ නම්, මා එය දකින්නේ කවදාද?"

මෙයට සුදුසු පිළිතුර ලියා ඇත්තේ දේශනාකාරයා 3:17 පදයේය ❤"මක්නිසාද සියලු කාරණාවලටත්, සියලු වැඩවලටත් කාලයක් (කිසියම් නිශ්චිත කාලයක්) පැමිණේයයි මාගේ සිතින් සිතා ගත්තේමි."

ඔබ පිළිබඳවවූ දෙවියන්වහන්සේගේ සැළසුම සහ අරමුණු ක්‍රියාවට නංවනුයේ උන්වහන්සේගේම කාලවේලාවටමයි අප විසින් කළ යුතු වන්නේ පේත්‍රුස් පටන්ගත් ආකාරයට, එනම් සුදුසු කාලයේදී නුඹව උසස් කරන පිණිස දෙවියන්වහන්සේගේ බලවත් හස්තයට යටත්වීම පමණී (1 පේත්‍රුස් 5:6).

දෙවියන්වහන්සේ තම අනාගතවකතෘවරයාට දර්ශනයකින් පෙනී සිටිමින් අනාගතය පිළිබඳවවූ උන්වහන්සේගේ සැළසුම අන් අයවලුන්ටත්, දකින්නට ලැබෙන ලෙසට ලියා තැබීමට අණ කළ සේක් නමුත් ඊළඟ පදයෙන් උන්වහන්සේ මෙසේ පැවසූ සේක් ❤"මක්නිසාද දර්ශනය නියම කාලය දක්වා තවම ප්‍රමාද වේඨ එහෙත් එය බොරු නොවී ඉක්මනින් තීන්දුවට පැමිණෙන්නේයි එය ප්‍රමාද වෙතත් ඒ ගැන බලා සිටපන්නඨ මක්නිසාද එය පසු නොබැස පැමිණෙනවාම ඇති" (හබක්කුක් 2:3).

හේබ්‍රෑව් පොතේ කතෘවරයා 6:18,19 පද ලියා ඇත්තේ ❤"අප ඉදිරියේ තබා තිබෙන බලාපොරොත්තුව අල්ලාගැනීමට ආරක්ෂාවා පිණිස පලා ආවාවූ අපට මහත් ධෛර්‍ය්‍යයක් ලැබෙන පිණිසයි ඒ බලාපොරොත්තුවේ ආත්මයේ සන්තකවූ, ස්ථිරවූ, තිරයෙන් ඇතුළට යන්නාවූ නැංගුරමක් මෙන් අපට ඇත්තේයි."

පාවුල් මෙසේ පවසයි ❤"තවද දෙවියන්වහන්සේට ප්‍රේමකරන්නන්ට, එනම්, උන්වහන්සේ අභිප්‍රාය ලෙස කැඳවනු ලැබුවන්ට, සියලු දේම යහපත පිණිස එකට ක්‍රියා කරන බව අපි දනිමුව්" (රෝම 8:28). පසුව, එපීස යැවුම් පත්‍රයෙන්, අපට අරමුණක් ඇති බව මතක් කර දෙමින් මෙසේ පවසයි "ඉතින් අප තුළ ක්‍රියා කරන්නාවූ (උන්වහන්සේගේ ක්‍රියාව) බලයේ හැටියට අපි (නොබියව) ඉල්ලන නොහොත් සිතන (අපගේ සියලු යාච්ඤාවන්, අශාවන්, සිතුවිලි, බලාපෝරොත්තුවෙන් සිහින) හැම දේට (ප්‍රතිවිපාකයන්ට) වඩා ඉතා අධික ලෙස කරන්ට (උන්වහන්සේත් අරමුණ ක්‍රියිත්මක කිරීම) බලය ඇත්තාවූ තැනැන්වහන්සේටම." (එපීස 3:20).

ඔබ සිතනවාට වඩා ඔබ ජීවිතය තුළ මහත් දේ කිරීම උන්වහන්සේගේ අභිප්‍රාය බැවින් ඔබ බලාපොරොත්තුවෙන් පිරී සිටිම දෙවියන්වහන්සේට අවශ්‍ය වේ කෙසේ වුවද, යක්ෂයාට අවශ්‍යව තිබෙන්නාසේ ඔබ බලාපොරොත්තු රහිතව සිටින්නේ නම්, දෙවියන්වහන්සේ ඔබගෙන් අපේක්ෂා කරන කොටස, එනම් දෙවියන්වහන්සේට ඔබගේ ජීවිතය පිළිබඳව යහපත් සැලස්මක් තිබෙන බවත් හා එම සැලැස්ම ක්‍රමවත්ව ක්‍රියාත්මක වන බව විශ්වාස කරමින්, ඔබගේ බලාපොරොත්තු සහ අපේක්ෂාවන් උන්වහන්සේ තුළ තැබීමයි

එපීස 1:11 පදයෙන් පාවුල් ස්වාමීවූ යේසුස්වහන්සේ පිළිබඳව කථාකරමින් මෙසේ පවසයි ❤"එසේය, තමන්ගේ කැමැත්තේ මන්ත්‍රණය හැටියට (තමන්වහන්සේගේම) සියල්ල සිද්ධකරන්නා වූ තැනැන්වහන්සේගේ නියමය ප්‍රකාරයට, අපි පෙර නියම කරනු (පෙර තෝරා පත් කරන ලද) ලැබ ක්‍රිස්තුස්වහන්සේ තුළ (දෙවියන්වහන්සේගේ) උරුමයක් (කොටස) වී සිටිමුව."

යොෂුවා 1:8 පදයෙන් දෙවියන්වහන්සේ තම මෙහෙකරුවූ යොෂුවාට දෙන ලද ආඥාව මතකයට ගන්නී එනම්, ❤"මේ ව්‍යාවස්ථා පොත නුඹේ මුඛයෙන් පහ නොවේවී එහි ලියා තිබෙන සියල්ල කරන්ට බලාගන්නා පිණිස රෑ දහවල් ඒ ගැන මෙනෙහි කරන්නී එවිට නුඹේ මාර්ගය සඵලවී නුඹට ශුභ සිද්ධවන්නේයි."

ද්වීතීය කථාව 30:14 පදයෙන් පවසන දෙය, එනම්, ❤"නුමුත් ඒ වචනය ලෙස නුඹ කරන පිණිස එය නුඹට ඉතා ළංව නුඹේ මුඛයේද නුඹේ සිතේද තිබේ."

යෙසායා 55:11 පදයෙන් දෙවියන්වහන්සේගේ වචනය ප්‍රකාශ කිරීම තුළ උන්වහන්සේගේ අරමුණු අපගේ ජීවිත තුළ ක්‍රියාත්මක වන ආකාරය ස්වාමීන්වහන්සේ පෙන්වා දෙයී ❤"මාගේ මුඛයෙන් නික්මෙන මාගේ වචනයත් මා වෙතට හිස්ව (කිසි දෙයක් ඉෂ්ඨ නොකට) හැරී නෑවීත් මා කැමැති දෙය සිදු කොට, මා නියම කළ කාරණය සඵල කරනවා ඇති."

ඔබගේ මුඛය දෙවියන්වහන්සේටදී, එය දෙවියන්වහන්සේගේ මුඛය වීමට ඉඩ හරින්නී ඔබ වෙනුවෙන් යහපත් අනාගතයක්, යහපත් අරමුණක් සහ යහපත් සැළසුමක් ඇති බැවින් උන්වහන්සේගේ වචනය ප්‍රකාශකිරීම ආරම්භ කරන්නී සතුරුකමෙන් බැහැරව දෙවියන්වහන්සේ සමඟ එකඟව කථාකරන්නී.

අප සැම කෙනෙකුටම දිව්‍යමය දෛවයක් ඇති බව මතක තබාගන්නී.

අනාගතයේ ඔබ කවරාකාර පුද්ගලයෙක්වේයයි සිතන්නේද? ඔබගේ ජීවිතය යහපත් වෙනවා වෙනුවට වඩ වඩාත් අයහපත් වන්නේයයි ඔබ සිතන්නට පටන්ගැනීම යක්ෂයාගේ අවශ්‍යතාවයයී ඔහුට අවශ්‍ය ඔබ මෙතෙක් පැමිණි දුර පිළිබඳව සිතීම නොව ඔබට තවත් කොපමණ දුරක් යාමට ඇත්තේදැයි සිතීමයී.

ඔබ කිසිදා වෙනස් වන්නේ නැතැයි ඔබ සිතමින් ඉච්චාභංගත්වයට පත්වන්නේද? බලාපොරොත්තු තබාගන්නී දෙවියන්වහන්සේ සැම මොහොතකදීම ඔබව වෙනස් කරන්නේයී උන්වහන්සේගේ වචනය ඉතා බලවත්ව ඔබ තුළ ක්‍රියා කරන්නේයී.

උන්වහන්සේ අපට අපගේ සතුරා පරදවා ජයග්‍රහණය කිරීමට ක්‍රමානුකූලව අපට උපකාර කරන බව ද්විතීය කථාව 7:22 පදයෙන් මතක්කර දෙන්නේයි.

2 කොරින්ති 3:18 පදයෙන් පාවුල් පවසනුයේ, උන්වහන්සේගේ වචනය තුළින් ස්වාමීන්වහන්සේව දකින්නයයි වෙනස් වන අතර එය ඇත්තෙන්ම සිදුවන්නේමයි ❤"තේජසින් තේජසට වෙනස් කරනු ලැබීමුවී."

අපගේ අලුත් සිතුවිලි, අදහස් ආකල්පයන් ඇතුළත් අපගේ මුළු මනසම වෙනස් වියයුතු බව රෝම 12:2 පදයෙන් අපට පෙන්වා දෙයි එය මෙසේ අපට සහතිකයක් ගෙන දෙයි එනම්, ❤"මේ ලෝකයේ ආකාරයට සමාන නොවී දෙවියන්වහන්සේගේ කැමැත්ත, එනම්, යහපත් වු පිළිගත යුතුවු සම්පූර්ණවු දෙය කුමක්ද? කියා දැනගන්නා පිණිස, සිත අලුත් කරගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙයල්ලා (උන්වහ්නසේගේ දසුන් ඉදිරියේ ඔබ්)."

කොලොස්සී 1:27 පදයෙන් පාවුල් පෙන්වා දෙනුයේ, ක්‍රිස්තුස්වහන්සේ අප තුළෙහි වැඩවාසය කිරීම සහ බලාපොරොත්තුවේ මහිමය යුගවල අභිරහස් ලෙසටයි ඔබගේ ස්වර්ගීක පියාණන්වහන්සේ ඔබ මහිමයට පත්වීම දකිනා සේකී ඔබගේ මහිමයේ දැක්ම ඉෂ්ඨ කරගන්නා පිණිස දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේව ඔබ තුළ වැඩවාසය කරන පිණිස එව් සේකී.

"මහිමය" යන වචනය, අපගේ දෙවියන්වහන්සේගේ සියලු උත්කෘෂ්ටතාවයන් ප්‍රකාශ වීම ලෙසට මම නිර්වචනය කරමී ඔබගේ බලාපොරොත්තුව උන්වහන්සේ තුළ තබා, සියලු ශුද්ධ ලියවිලි කොටස් ඔබ උදෙසා බව විශ්වාස කරන්නී.

ධනාත්මක මෙන්ම ඇදහිල්ලෙන් පිරුණු සහ වචනය මත පදනම් වු ප්‍රකාශයන් ප්‍රකාශ කිරීමට ඉගෙනගන්නී ශබ්ද නගා මෙසේ පවසන්න "මා දෙවියන්වහන්සේගේ ස්වරූපයට තේජසින් තෙජසට වෙනස්, වෙනස් කරනු ලැබිමී" (2 කොරෙන්ති 3:18) "ක්‍රිස්තුස්වහන්සේ තුළ වැඩවාසය කිරීම යනු මාගේ බලාපොරොත්තු වඩවඩාත් මහිමයට

පත්වීමයි දෙවියන්වහන්සේගේ ආත්මය ස්වල්පයෙන් ස්වල්පයට දිනපතා මා වෙනස් කරන සේක් මාගේ ජීවිතය අරමුණක් ඇති මා පිළිබඳව දෙවියන්වහන්සේට යහපත් සැළසුමක් ඇත."

රෝම 4:17 පදයට අනුව, අප සේවය කරනුයේ, තිබිය යුතු ආකාරයට නොපවතින තත්ත්වයන් තුළදී අප කැඳවූ දෙවියන්වහන්සේටයි.

උන්වහන්සේගේ වචනයෙන් දෙවියන්වහන්සේ අප පිළිබඳව පවසනුයේ කුමක්ද?

> ❤"නමුත් අන්ධකාරයෙන් තමන්ගේ විශ්වාසයත් ආලෝකයට නුඹලා කැඳවා ගත් තැනැන්වහන්සේගේ උත්කෘෂ්ටතාවයන් දක්වන පිණිස නුඹලා වනාහි තෝරාගත් වංශයක්ද රාජකීය පූජකගේද ශුද්ධ ජාතියක්ද දෙවියන්වහන්සේ සන්තක (දෙවියන්වහන්සේගේ) සෙනගක්ද වන්නහුයි."
>
> 1 පේත්‍රුස් 2:9

දෙවියන්වහන්සේ අප උදෙසා සැළසුම්කර ඇති විශ්මපත් ක්‍රියාවන්, සුචරිතය සහ පරිපූර්ණත්වයට විවෘතව දකින පිණිස විදහා දැක්වීම හෝ පැහැදිලිව පෙනෙන්නට හා උදහස්වීම දෙවියන්වහන්සේගේ අභිප්‍රායයි.

"අඳුරෙන් දෙවියන්වහන්සේගේ මහිමයේ ආලෝකයට මා කැඳවා ගෙන ඇත" යනුවෙන් ප්‍රකාශ කිරීමට ඉගෙනගන්න.

දුර්වල ආත්ම ප්‍රතිබිම්බයක් තිබීම අඳුරයි ඔබ ඔබටම අකමැත්වීම අඳුරයි ඔබ තුළ වටිනාකමක් නැතැයි සිතීම පවා අඳුරුය.

මලාකි 3:17 පදයෙන් අපි ස්වාමීන්වහන්සේ ආභරණව, විශේෂ සන්තකයක් සහ අසමාන්‍ය සම්පතකි ඔව් ඔබ වටිනා කෙනෙකු වන අතර ඔබට අරමුණක් ඇත ඔබට දෛව්‍යයක් ඇත ඔබගේ ජීවිතය පිළිබඳව දෙවියන්වහන්සේ මහත් සැළසුමක් ඇත ඔබ විසින් රඟ දැඟවිය යුතු භූමිකාවක් ඉතිහාසයේ ඇති නමුත් එය ලබාගැනීම පිණිස ඔබ එය විශ්වාස කළ යුතුයි.

සමහරවිට ඔබ, “නමුත් ජොයිස් මම බොහෝවර අසර්ථක වී ඇති මම බොහෝ අත්වැරදීම සිදුකර ඇත්තෙමි දෙවියන්වහන්සේව ශෝකයට පත්කළ බවත් මම දනිමි,” යනුවෙන් පැවසීමට පුළුවනි.

පිලිප්පි 3:13,14 පදවලින් පාවුල් තවමත් පරිපූර්ණත්වයට පැමිණ නැති බව ඔහු ප්‍රකාශ කරයි නමුත් ඔහු තවදුරටත් පවසනුයේ, ඔහු මෙය අත් නොහරින බවයි.

> ❤“සහෝදරයෙනි මම තවමත් අල්ලාගත්තෙමියි නොසිතමි (තවමතී) නුමුත් එකක් කරමි (මාගේ එක් අභිලාෂයකි) එනම්, පස්සෙන් තිබෙන දේ මතක නැතිකොට, ඉස්සරහට තිබෙන ඒවා දෙසම බලාගෙන යමින්,
>
> ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ උතුම් කැඳවීමේ දිනුම (උත්තරීතර සහ ස්වර්ගීක) පිණිස දිනුම් පළ දුවමි.”

දෙවියන්වහන්සේට ඔබ පිළබඳව යහපත් සැළසුමක් ඇති ඔබ අතීතයේ ජීවත් නොවන්නී යෙසායා 43:18,19 සඳහන් ස්වාමින්වහන්සේගේ වචනයට ඇහුම්කන් දෙන්නී

> ❤“පළමු කාරණා සිහි නොකරල්ලා (බලවත් ඕනෑකමින් යුතුය) පුරාණ දෙවල්ද කල්පනා නොකරල්ලා.
>
> බලව, මම අමුතු දෙයක් කරන්නේමිඨ දැන් ඒක හටගන්නවා ඇතඨ නුඹලා ඒක නොදන්නහුද? මම කාන්තාරයේහී පවා මාර්ගයක්ද වනයෙහි ගංගාද සාදන්නෙමි.”

අවසාන ලෙසට යෙසායා 43:25 පදයෙන් දෙවියන්වහන්සේ ඔබට කුමක් පවසන්නේදැයි ඇහුම්කන් දෙන්නීඃ ❤“මම, මමම, මා නිසා නුඹේ පාපවල් සිහි නොකොට, නුඹේ වරද මකා දමන තැනැන්වහන්සේයි.”

උන්වහන්සේගේ සැළසුම ආකාරයට ඔබ පත්වීම දැකීම දෙවියන්වහන්සේගේ අවශ්‍යතාවයයි ඔබ උදෙසා දෙවියන්වහන්සේ විසින් පෙර සූදානම් කළ යහපත් ජීවිතය පූර්ණ ලෙසින් ඔබ විඳිනු දැකීම උන්වහන්සේට අවශ්‍යවේ අතීතයේ ඔබ විසින් කරන ලද සියලු වැරදි ක්‍රියාවන්ට උන්වහන්සේගෙ අනුග්‍රහය සහ කරුණාව කරණකොටගෙන ඉවත් කිරීමට උන්වහන්සේ කැමැත්තෙන්ම සිටින සේක් එසේම, ඔබ අනාගතයේදී කරන්නට යෙදෙන අත්වැරදීම් සියල්ලමද ඉවත්කිරීමට ඔබටම ඉඩ සළසාදී ඇත.

අතීතය වෙනුවෙන් දැන් ඔබට බලවත් කණස්සල්ලකින් හෝ අනාගතය පිළිබඳව බියකින් යුතුව ජීවත්වීමට අවශ්‍ය නැති ඔබට අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී උන්වහන්සේ ඔබට උපකාර කිරීමට කැමැත්තෙන්ම සිටින සේක්.

යෙසායා 40:31 පදයේ මෙසේ පොරොන්දු වී ඇත ❤“නුමුත් ස්වාමීන්වහන්සේ ගැන බලා සිටින්නෝ තමුන්ගේ සවිය අලුත් කරගන්නේයඨ ඔව්හු රාජාලීන් මෙන් පියඹා නඟින්නෝයඨ ඔව්හු දුවන්නෝය, එහෙත් වෙහෙස නොවෙතිඨ ඔව්හු ඇවිද්න්නෝය, එහෙත් ක්ලාන්ත නොවෙති.”

ඉදිරි කාලයේදී ඔබට මුහුණදීමට සිදුවන දේ උදෙසා දෙවියන්වහන්සේගේ නොවෙනස් වන්නාවු ප්‍රේමය හා විශ්මපත් ක්‍රියාවන් තුළින් අපට පුදුමය උපදවන්නාවු සහතිකයක් අපට ලබාදී ඇත.

උන්වහන්සේගේ පුදුමය දනවන පොරොන්දුවලින්ද, බලාපොරොත්තුවලින්ද, විශ්වාසයෙන්ද සම්බන්ධව ඇති උන්වහන්සේගේ අනර්ඝවු සැළසුම තුළ උන්වහන්සේ පොරොන්දුවූ සියල්ල ඉටුකිරීමට උන්වහන්සේට හැකි බවට සහතිකයක් ඇත (රෝම 4:21).

පසුපස නොබලා ඉදිරියම බලන්නී ඇදහිල්ලෙන් පියවර තබන්නී.

ඔබට දිව්‍යමය පෙර සැළසුමක් ඇති බව මතක තබාගන්නී.

# 3

# ක්‍රිස්තුස්වහන්සේ තුළ ඔබගේ ධර්මිෂ්ඨකම හඳුනාගැනීම

දැන් මම ඔබ සමඟ ධර්මිෂ්ඨකම දක්වා ඇති ශුද්ධලියවිලි කොටස් කිහිපයක් බෙදා ගැනීමට කැමැත්තෙමි

"දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකමට මා සදා ඇති" යම් ගීතයෙන් දෙවියන්වහන්සේගේම පවුලට සහ යේසුස්වහන්සේ තුළ සම්පූර්ණ වුණාවූ සහ උන්වහන්සේ සමඟ උරුමය ලැබුවාවූ ද, පාපයෙන් තොර වූ සහ උන්වහන්සේගේ අනර්ඝ රුධිරයෙන් මිළදී ගත්තාවූ රාජ වංශයක සමාජයකු ලෙස උන්වහන්සේගේ සිංහාසන අභිමුඛයේ සිටින්නේමි.[1]

2 කොරෙන්ති 5:21 පදයට අනුව පාවුල් පවසනුයේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම ඔබය යන්නයි ❤"අප (පළඳවා, එසේ පෙනෙන පිණිස, සහ ආදර්ශ ලෙසට) උන්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම (සිදුවිය යුතුවූ අනුමත සහ පිළිග න්නා ලද සහ නිසි සම්බන්ධතාවයක් පැවැත්වීම, උන්වහන්සේගේ යහපත්කම නිසාී) පාපයක් නොදත්තාවූ උන්වහන්සේ (සැබවින්ම

[1]හැදළු බදළු (1) පදමාලාව සහ සංගීතය ක්‍රිස් සෙල්මය (ජ) 1992 වචනය තුළ ජීවිතය විසිනි

ක්‍රිස්තුස්වහන්සේ) අප වෙනුවට පාපය වෙන්කොට (දෙවියන්වහන්සේ) සැලැස්වූ සේක්."

ගීතාවලිය 48:10 පදයෙන් ස්වාමීන්වහන්සේ මෙසේ පවසයි ❤"දෙවියන්වහන්සේ ඔබගේ නාමය ලෙසම ඔබගේ ප්‍රශංසාවත් පොළොවේ සීමා දක්වාවේ ඔබගේ දකුණත ධර්මිෂ්ඨකමින් (ධර්මිෂ්ඨකම සහ යුක්තිය) පූර්ණයි."

පූර්ණ ධර්මිෂ්ඨකමෙන් යුතුව දෙවියන්වහන්සේගේ හස්තය ඔබ වෙතට දිගුකර ඇත.

1 කොරින්ති 1:8 පදයෙන් පාවුල් සහතිකයක් දක්වා ඇති ❤"අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ (මෙසියසිවහන්සේ) දවසේදී නුඹලා දෝෂ රහිතව සිටින පිණිස උන්වහන්සේ (අචල විශ්වාසයකින්, ශක්තිය දෙමින්, නිර්දෝෂී බවට පත්කරමින්ධ සියලු චෝදනාවන්ට සහ ද්‍රෝෂාරෝපණයන්වලට එරෙහිව නැඟීසිටිමට බලය දෙන තැනැන්වහන්සේයි) අන්තිම (දෙවියන්වහන්සේ) දක්වා නුඹලා ස්ථිර කරන සේක්."

එහි අර්ථය ඔබ දන්නෙහිද? මෙයින් අර්ථවත් කරනුයේ ඔබ දැන් උන්වහන්සේගේ දකුණු පාර්ශවයේ සිටින බවයි අද උන්වහන්සේ ඔබව ඔබ සිටිය යුතු ස්ථානයේ තබා ඇති සහෝදරත්වයේ ද්‍රෝෂාරෝපණය කරන්නාවූ සාතන්ගේ බොරුවලට එරෙහිව නැඟීසිටීමට උන්වහන්සේ සැමවිටම සූදානම්ව සිටින සේක් (එළිදරව් 12:10).

ඔබ ඔබගේ විශ්වාසය යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි තබන්නේ නම්, දෙවියන්වහන්සේ ඔබව සදොස්ව දකින්නේ නැති උන්වහන්සේ ඔබගේ අහිංසකත්වය සහතික කිරීමට කැමැත්තෙන්ම සිටින සේක්.

කන්ද උඩ දේශනාවේදී, යේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට මෙසේ පැවසූ සේක්: ❤"ධර්මිෂ්ඨකමට (ඍජුව සහ දෙවියන්වහන්සේ සමඟ සිටගනිමින්) සාපිපාස ඇත්තෝ ආශීර්වාදලද්දෝයධ මක්නිසාද ඔව්හු තෘප්තියට (නැවත උත්පාදනය ලැබූවාවූ දෙවියන්වහන්සේගේ දරුවෙකු උන්වහන්සේගේ උපකාර විඳින ආකාරයේ(1) පැමිණෙන්නෝයි" (මතෙව් 5:6).

යේසුස්වහන්සේට අනුව, ඔබ දැන් නැවත උත්පාදනය වුණාවූ දෙවියන්වහන්සේගේ දරුවෙකු ලෙසට උන්වහන්සේගේ උපකාරය විඳීමට තරම් සුදුසුස්සෙකු වී ඇති ඔබට ඔබගේ ජීවිතය විඳීමට අයිතියක් ඇති එය දෙවියන්වහන්සේ ගෙන්ලත් ත්‍යාගයකි.

මෙම ප්‍රකාශනය ප්‍රකාශ කිරීමට ආරම්භ කරන්නී "මම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකමයි."

සමහරවිට ඔබ දෙවියන්වහන්සේ සමඟ යුක්ති ධර්මය සාදාගැනීමට උත්සහයක යෙදෙනවා විය හැකි ධර්මිෂ්ඨකම පැමිණුනුයේ ඒ ආකාරව නොවේයි ධර්මිෂ්ඨකමද ගැළවීම මෙන්ම ක්‍රියාවක් නොවේයඩ එය ත්‍යාග යකි ඔබගේ උත්සහයන් අත්හැර ක්‍රිස්තුස්වහන්සේගේ ධර්මිෂ්ඨකමේ පංගුකාරයෙක් වන පිණිස දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබන්න ඉගෙනගන්නී.

❤"නුඹේ බර ස්වාමීන් පිට තබව, උන්වහන්සේ නුඹ උසුලන සේකි උන්වහන්සේ කිසිකලකත් (නොකඩවා) ධර්මිෂ්ඨයා සෙලවෙන්නට (ලීස්සීමට, වැටීමට හෝ බෙලහීන වීමට) නොදෙන සේකී" (ගීතාවලිය 55:22).

ආබ්‍රහම්ගේ ධර්මිෂ්ඨකම පිළිබඳව පාවුල් රෝම 4:1-3 පදවලින් කථාකර ඇතීඃ

> ❤"එසේ වී නම් මාංසාකාරයෙන් අපේ මුල් පියවූ ආබ්‍රහම්ට කුමක් (ඔහුගේ තත්ත්වයේ බල පැවැත්ම, සහ ඔහුගෙන් ලබා ගත් දේ) ලැබුණේයයි කියමුද? (ඔහු කරන ලද දේ)
>
> මක්නිසාද ආබ්‍රහම් ක්‍රියා (එකළ ඔහු කරන ලද) කරණකොටගෙන ධර්මිෂ්ඨ (චෝදනාවලින් නිදොස්කොට පිහිටුවීම) කරන ලද්දේ වී නම්, ඔහුට පාරට්ටුකර ගැනීමට කාරණයක් ඇතඩ නුමුත් දෙවියන්වහන්සේ ඉදිරියෙහි නොවේයී
>
> මක්නිසාද ලියවිල්ලේ කුමක් කියා තිබේද? ආබ්‍රහම් දෙවියන්වහන්සේව විශ්වාසය (බලාපොරොත්තු තැබීම)

කළේයි එය ඔහුට ධර්මිෂ්ඨකම (නියමාකාරව ජීවත්වීම සහ නියමාකාරව දෙවියන්වහන්සේ ඉදිරියේ සිටිම) කොට ගණන් ගන්නා ලද්දේයි කියයි.”

ඉන්පසු එම පරිච්ඡේදයේම 23, 24, පදවලින් පාවුල් තුමා වැඩිදුරටත් පවසනුයේඨ:

❤“ඉදින් ඔහුට එය ගණන් ගන්නා ලදැයි ලියනු ලැබුමේ (ඒ වචන) ඔහු නිසා පමණක් නොව (ඒවා ලියන ලද්දේ) අප නිසාත්යි

මක්නිසාද අපේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සෙව මළවුන්ගෙන් නැගිටෙවූ තැනැන්වහන්සේ කෙරෙහි අදහන්නාවූ (විශ්වාස කිරීම, ඇල්ම, මත යැපීම) අපටත් එය (ධර්මිෂ්ඨකම, දෙවියන්වහන්සේ ඉදිරියේ පිළිගන්නා වූ) ගණන් ගනු ලබන්නේයි.”

පාවුල් මෙහිදි කියනු ලබන දේ වෙනත් වචනයකින් පවසන්නේ නම්, ධර්මිෂ්ඨකම අප ලබා ගත්තේ ක්‍රියා කිරීමෙන් නොව අදහා ගැනීමෙන් බවයී.

අපි යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි විශ්වාස කළ විට දෙවියන්වහන්සේ අපව දකිනුයේ ධර්මිෂ්ඨවයි පදාර්ථයට අනුව යේසුස්වහන්සේගේ රුධිරය කරණකොටගෙන අප උන්වහන්සේ සමඟ ධර්මිෂ්ඨව දැකීමට දෙවියන්වහන්සේ තීරණය කරන බවයී උන්වහන්සේ සර්වබලධාරි දෙවියන්වහන්සේ වන අතර එසේ කිරීම උන්වහන්සේගේ තේරීම නම්, එවැනි තීරණයක් ගැනීමට උන්වහන්සේට බලයද ඇතී.

ඊළඟ පර්ච්ඡේදයේ පළමු පදයෙන්ම පාවුල් මේ සංසිද්ධිය සම්පින්ඩනයක් කොට ඉදිරිපත් කර ඇතී. ❤“එබැවින් අපි ඇදහිල්ලෙන් (අප විසින් කරනු ග්‍රහණය කොටගෙන) ධර්මිෂ්ඨ කරනු ලැබ (නිද්‍රොස් කොට, ධර්මිෂ්ඨකම ප්‍රකාශකර, දෙවියන්වහන්සේ සමඟ සිටීමට වර

දානය කිරීම) අපේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ (මෙසියස්වහන්සේ, ආලේපලත්) කරණකොටගෙන දෙවියන්වහන්සේ හා සමඟ (සමාදානයේ සමඟිසංධානවීම ග්‍රහණය කරගෙන එය විඳීම) සමාදානය ඇතුව සිටිමුණී." (රෝම 5:1).

අපගේ දුර්වල ක්‍රියා කරණකොටගෙන ධර්මිෂ්ඨකම නොපැමිණෙන්නේය. එය යේසුස්වහන්සේ විසින් සම්පූර්ණකොට අවසන් කරන ලද ක්‍රියාවෙන් පැමිණේ.

දාවිත් ගීතාවලිය 37:25 පදයේ මෙසේ පවසයි ❤"මම යෞවනව සිටියෙමි, දැන් මහලුව සිටිමි. එසේවී නමුත් (සමත සාධනයට අකමැති නොවන) ධර්මිෂ්ඨයා අත්හරිනු ලැබූ බවවත්, ඔහුගේ වංශය කෑම සිඟන බවවත්, නුදුටිමි."

දෙමාපියන් ලෙස අපි ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේ සමඟ ධර්මිෂ්ඨව හිඳීම අල්ලාගෙන සිටීමට හැකිවන්නේ නම් අපගේ දරුවන්ටද වැඩෙන්නට හැකි වන්නේයි.

සදොස්භාවයෙන් යුතු, වරදකාර හැඟීම ඇති සහ තමන් නොවටින්නේ යැයි සිතන්නාවූ දෙමාපියන් සමඟින් ඇති දැඩිවන දරුවන් සාමාන්‍යයෙන් තමන්ගේ දෙමාපියන්ගේ හැඟීම් දරන්නෝයි.

එලෙසම, දෙවියන්වහන්සේ තමන්ට ප්‍රේමකරන බවත්, උන්වහන්සේට ඔවුන් විශේෂ බවත්, දෙවියන්වහන්සේගේ යහපත් සැලසුමක් ඔවුන් කෙරෙහි තිබෙන බවත්, ක්‍රිස්තුස්වහන්සේගේ රුධිරය කරණකොටගෙන ධර්මිෂ්ඨ කරනු ලැබූ බවත්, තේරුම්ගෙන විශ්වාස කරන්නේ නම්, ඔවුන්ගේ දරුවන්ද තම දෙමාපියන්ගේ ඇදහිල්ල කරණකොටගෙන යේසුස්වහන්සේව සහ උන්වහන්සේගේ පොරොන්දු තමන් සතු කරගනිමින් සත්‍යතාවයේ ආවරණද ලබන්නේයි.

හිතෝපදේශය 20:7 අපට මෙසේ පවසයි, ❤"තමාගේ ඇදනැතිකමින් හැසිරෙන්නා ධර්මිෂ්ඨයෙක්යි ඔහුට පසු ඔහුගේ දරුවෝ වාසනාවන්තයෝ (ප්‍රිත්මත්, වාසනාවන්ත, අන් අය විසින් ඊර්ෂ්‍යා උපදවන) වෙති."

ගීතාවලිය 37:39 පදයෙන් අපි මෙසේ කියවා ඇත්තෙමු ❤"නුමුත් ධර්මිෂ්ඨයන්ගේ ගැළවීම (නිරතුරුවම) ස්වාමීන්ගෙන්යි විපත්ති කාලයේදී උන්වහන්සේ ඔවුන්ගේ බලකොටුව වන සේක."

ස්වාමීන්වහන්සේ ඔබගේ පක්ෂයේයි උන්වහන්සේගේ වචනය සත්‍යය වන අතර එමගින් සමාදානය, ධර්මිෂ්ඨකම, රැකවරණය සහ විරුද්ධවාදීන්ට එරෙහිව විජයග්‍රහණය කිරීම පොරොන්දු වී ඇති.

යෙසායා 54:17 පදයේ දක්නට ලැබෙන මෙම පොරොන්දුව ප්‍රකාශ කිරීමට ඉගෙනගන්නීඃ ❤"නුඹට විරුද්ධව සාදන කිසිම ආයුධයක් සඵල නොවන්නේයඩ විනිෂ්චය කිරීමට නුඹට විරුද්ධව නැඟීටින සියලුම දිව් නුඹ විසින් වරදට පත්කරනවා ඇති ස්වාමීන්වහන්සේගේ මෙහෙකරුවන්ගේ (ස්වාමීන්වහන්සේව ප්‍රත්‍යත්පාදනයවූ මෙහෙකරුවනී) උරුමයත් (සමාදානය, ධර්මිෂඨකම, ආරක්ෂාව, විරුද්ධවාදීන්ට එරෙහිව විජයග්‍රහණය) මාගෙන් ඔවුන්ට ලැබෙන ධර්මිෂ්ඨකමත් එයාකාරයයි (මාගේ කොටස ලෙස මා විසින් ඔවුන්ට දෙනු ලබනුයේ යුක්තියයි ස්වාමීන්වහන්සේ කියන සේකී"

ගීතාවලිය 34:15 පදයෙන් දාවිත් අපට මෙසේ පවසයිඃ

> ❤"ස්වාමීන්ගේ ඇස් ධර්මිෂ්ඨයන් දෙසටත් (ස්ථිර ලෙස) උන්වහන්ගේ කන් ඔවුන්ගේ මොරගැසීමටත් යොමා තිබේ."

වචනාර්ථයට අනුව, මෙහිදී දෙවියන්වහන්සේ අපට ප්‍රේමකරන බැවින් උන්වහන්සේ අප දෙස බලමින් සහ අපට සවන් දෙන බව පෙන්වා දේ.

ඊළග'ට 17, 19 සහ 22 පදවලින් දාවිත් තවදුරටත් මෙසේ පවසයීඃ

> ❤"ධර්මිෂ්ඨයෝ මොරගැසුවෝය, ස්වාමීන්වහන්සේ අසා ඔවුන්ගේ සියලු දුක්වලින් ඔවුන් ගැළවූ සේකී
>
> ධර්මිෂ්ඨයාගේ පීඩා බොහෝයී (නිරතුරුවම/නොකඩවා) නුමුත් ස්වාමීන්වහන්සේ ඒ සියල්ලෙන් ඔහු ගළවන සේකී

ස්වාමීන්වහන්සේ ස්වකීය මෙහෙකරුවාගේ ආත්මය මුදන සේක් උන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන කිසිවෙක්වත් වරදට පත් කරනු නොලබන්නේයි."

ඔබ යේසුස්වහන්සේව ඔබගේ ගැළවුම්කරුවාණන් ලෙසට පිළිගත් මොහොතේ පටන් ඔබ උන්වහන්සේ තුළ වර්ධනය වන්නේයි ඔබ ගමනක නිරතව සිටින බව සමහරවිට ඔබ පවසයි ඔබ මේ ගමනේ ගමන්කිරීමේදී ඔබ අතින් කිසියම් අත්වැරදීම් සිදුවේ ඔබගේ ක්‍රියාකාරකම්ද සමහරවිට පරිසමාප්ත නොවේ නමුත්, ස්වාමීන්වහන්සේ කෙරෙහි ඔබගේ හදවත පරිසමාප්තව ඇත්තේ නම්, ගමනේ ගමන් කරද්දී උන්වහන්සේ ඔබව පරිසමාප්ත ආකාරයට පිළිගන්නා බවට මා තුළ විශ්වාසය ඇත.

යෙසායා 54:14 පදයෙන් ස්වාමීන්වහන්සේ මෙසේ ප්‍රකාශ කරයි "නුඹ ධර්මිෂ්ඨකමෙන් (අයිතිවාසිකම, දෙවියන්වහන්සේගේ කැමැත්තට සහ පිළිවෙලට සමානුරූපව) පිහිටුවනු ලබනවා ඇත නුඹ බලාත්කාරයෙන් දුරුව භය නැතුව සිටින්නෙහියඬ භීතියෙනුත් දුරුව සිටිනවා ඇත ඒක නුඹට ළං නොවන්නේයි."

හිතෝපදේශ 28:1 පදය, ධර්මිෂ්ඨකමෙහි ස්ථිරව සිටින්නා සිංහයෙකු මෙන් නිර්භීත බව පෙන්වයි ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන ඔබ ධර්මිෂ්ඨයයි ඔබ දන්නා විට හා මේ පිළිබඳව සැබෑ එළිදරව්වක් තිබෙන විට, ඔබ තවදුරටත් භියෙන් සහ තැතිගැන්මෙන් ජීවත් නොවන්නේයි මන්ද, ධර්මිෂ්ඨකම නිර්භීතකම උපදවන බැවිනි.

❤"මක්නිසාද අපට සිටින්නේ අපේ දුර්වලකම්වලදී අපේ දුක නොදැනෙන උත්තම පූජකයෙක් නොව, පව්කිරීමක් නැතුව, සියලු ආකාරයෙන්ම අප වාගේ පරීක්ෂා කරනු ලැබූ උත්තම පූජකයෙක්යි

එබැවින් අපට දයාව (අපගේ අසමාර්ථයන්ට) ලැබෙන පිණිසද අපේ ඕනෑකම්වලදී (සුදුසු උපකාර, සහ නියමිත වේලාවට සුදුසු උපකාර, අපට අවශ්‍ය වේලාවේදී සැපයීම) අපට උපකාරයට අනුග්‍රහය සම්බවන පිණිසද නිසැකකමින්

කරුණාවේ සිංහාසනයට (අප කව්කරුවන්ව සිටියදීම අප ලැබූ උන්වහන්සේගේ විශිෂ්ඨ නිර්මල ප්‍රේමය) ළඟා වෙමු.
හේබ්‍රෙව් 4:15,16

දෙවියන්වහන්සේගේ අනුග්‍රහයේ සිංහාසනය වෙතට අපට නිර්භීතව යා හැක්කේ අපගේ පරිපූර්ණත්වය නිසා නොව උන්වහන්සේගේඩ: ❤"එබැවින් ඊටත්වඩා (නිෂ්චිතවම) ක්‍රිස්තුස්වහන්සේගේ ලේ කරණකොටගෙන ධර්මිෂ්ඨ කරනු (නිදොස් කර, ධර්මිෂ්ඨ කොට, සහ දෙවියන්වහන්සේ සමග නියම සම්බන්ධතාවයකට පමුණුවා ඇති) ලැබූ අපි උන්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේගේ උදහසෙන් ගළවනු ලබන්නේමුව්." (රෝම 5:9)

සමහරවිට ඔබගේ මුළු ජීවිතයම තුවාලයක්ව, "මට මේ කුමක්ද සිදුවී ඇත්තේ," දැයි පවසනු ඇති.

එසේ නම්, මම ඔබට යහපත් ආරංචියක් පවසන්නෙමි ඩ ඔබව ධර්මිෂ්ඨ කොට ඇති.

දැන් ඔබ පිළිබඳව නියම දෙයක් ඇති.

මම සැමවිට මනුෂ්‍යයන්ව දිරිගන්වන ප්‍රකාශන කිහිපයක් ඇති "මට අවශ්‍ය තැන මා දැන් නොසිටිනවා විය හැකි නමුත් දෙවියන්වහන්සේට ස්තුති වේවා ණි මා සිටි තැන මා දැන් නැති එය මට යහපතකි මා දැන් මගේ ගමනේ ඇති."

මතක තබාගන්නි වෙනස යනු ක්‍රියාවලියකි ඔබ ඒ ක්‍රියාවලියේ ඇති ඔබ වෙනස් වන විට, දෙවියන්වහන්සේ ඔබව ධර්මිෂ්ඨව දකින සේකි.

ඔබ ධර්මිෂ්ඨයි යේසුස්වහන්සේගේ රුධිරය කරණකොටගෙන දෙවියන්වහන්සේ ඔබ තැබූ ස්ථානය එයයි.

ඔබගේ ජීවිතය තුළ වෙනස්වීම සිදුවනුයේ ධර්මිෂ්ඨකම ස්ථාපිත වීමයි එය ඇදහිල්ල කරණකොටගෙන දෙවියන්වහන්සේ විසින් දැනටමත් ඔබට ලබාදී ඇති.

දෙවියන්වහන්සේට මහිමය වේවා ණී.

මෙය බලවත්ය ණී.

දෙවියන්වහන්සේගේ ප්‍රේමයත් ධර්මිෂ්ඨකමත් ඔබ ලබද්දී, ඔබව අනාරක්ෂිතභාවයෙන් සහ ප්‍රතික්ෂේප වීමේ බියෙන් මුදවන්නේයි

මේ දැන්ම මොහොතකට නැවතී, මෙසේ ප්‍රකාශ කරන්නී "මම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකමය" මෙම ප්‍රකාශනය දවසට කිහිප වාරයක් ප්‍රකාශ කරන්නයි ඔබ දිරමත් කරන්නෙමී.

රෝම 14:17 පදයෙන් පාවුල් අපට මෙසේ පවසයි ❤"මක්නිසාද දෙවියන්වහන්සේගේ රාජ්‍යය කෑමත් බීමත් නොව, ධර්මිෂ්ඨකමද සමාදානයද ශුද්ධාත්මයාණන් තුළ ප්‍රීතියද වේ" ධර්මිෂ්ඨකම සමාදානය වෙතටද, සමාදානය ප්‍රීතිය වෙතටද අප යොමු කරයි.

ඔබ තුළ සමාදානය සහ සතුට හිඟව ඇත්තේ නම්, සමහරවිට ඔබට ධර්මිෂ්ඨකම මෙතෙක් එළිදරව් වී නැති ඔබට කායිකවද, මූල්‍යමමද ආශීර්වාද කිරීමට දෙවියන්වහන්සේට අවශ්‍යයි.

කෙසේවුවද, සදොස්භාවයෙන් පිරි, ද්‍රෝෂාරෝපනයේන් පිරී මනුෂ්‍යයන්ම සැබෑ සපලත්වය නොලැබෙන්නේයි බයිබලය අපට උගන්වනුයේ ධර්මිෂ්ඨ සියල්ලෝ ධර්මිෂ්ඨවත්, සපලත්වයෙනුත් සහ ආරක්ෂිතවත් සිටින බවයි.

ඔබ පිළිබඳව දෙවියන්වහන්සේ පවසන දේ කුමක්දැයි ඔබ දන්නේහිද? ගීතාවලිය 1:2-5 පදය උන්වහන්සේ ඒ පිළිබඳව මෙසේ පවසයි එනම්, ස්වාමීන්ගේ ව්‍යාවස්ථාවෙහි ප්‍රීතිවන්නාවූ, උන්වහන්සේගේ ව්‍යවස්ථාව රෑ දවල් මෙනෙහි කරන්නාවූණී මනුෂ්‍යයා ආශීර්වාදලද්දෝයි ඔහු දිය ඇළවල් ළඟ හිඳුවාවූ, නියමකලට එල දෙන, නොමැලවෙන කොළ ඇති ගසක් හා සමාන වන්නේයඛ ඔහු කරන සියල්ල සඵල වෙයි.

දෙවියන්වහන්සේ සමඟ සිටිය හැකි නියම දේ පමණක් මෙනෙහි කරන්න, නමුත් වැරදි කිසිවක් එසේ නොකරන්නී.

යොෂුවා 1:8 පදයෙන් අපි මෙසේ දැක්කෙමු ❤"මේ ව්‍යාවස්ථා පොත නුඹේ මුඛයෙන් පහ නොවේවා, එහි ලියා තිබෙන සියල්ල කරන්ට බලාග න්නා පිණිස රෑ දාවල් ඒ ගැන මෙනෙහි කරන්නී එවිට නුඹේ මාර්ගය සඵලවී නුඹට ශුභසිද්ධවන්නේයි."

ගීතාවලිය 1:2, 3 පදවලට අනුව දෙවියන්වහන්සේගේ වචනය දිවා රෑ නිරතුරුවම මෙනෙහි කිරීමෙන් හොඳින් වැඩිඵල ගෙන දෙන්නාවු ගසක් මෙන් ඔබ සියල්ලේදී සඵලවන බව පෙන්වා දේ

වචනය මෙනෙහිකර වචනය ප්‍රකාශ කරන්නී සාතන් විසින් ඔබගේ මනසට පහරදීමක් සිදුකරන විටදී, දෙවියන්වහන්සේගේ වචනය භාවිතාකරමින් ඔහුට එරෙහිව මුහුණට මුහුණ පහර දෙන්නී යේසුස්වහන්සේ යක්ෂයාව පරාජය කරන පිණිස දෙවියන්වහන්සේගේ වචනය භාවිතා කළ බව මතක තබාගන්නී ❤"එසේ ලියා ඇතී" (ලූක් 4:4, 8,10).

හිතෝපදේශ 18:10 පදය මෙසේ පවසයී ❤"ස්වාමීන්වහන්සේගේ නාමය බලකොටුවක්යී (නිරතුරුවම) ධර්මිෂ්ඨයා (ඍජු සහ දෙවියන්වහන්සේ සමඟ නියමාකාරව සිටීම) එහි දුවගොස් සුරක්ෂිත වෙයී (යක්ෂයාට ඉහළින්)."

ගීතාවලිය 72:7 පදයෙන් ධර්මිෂ්ඨයා, ❤"සඳ නැතිවනතෙක්ම බොහෝ සමාදානයද වන්නේයී" දෙවියන්වහන්සේ සමඟ උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම පිළිගන්න, එවිට ඔබගේ සමාදානය මල්පල ගැන්වීමට ආරම්භ කරන්නේයී.

"මා විසින් කරන ලද සියලුම ඉතා නරකම දේ පිළිබඳව කුමක් සිදුවේද?" යනුවෙන් ඔබ සිතනවා විය හැකී.

දෙවියන්වහන්සේ තමන්ගේ සෙනඟ පිළිබඳව කථා කළ වචන හේබ්‍රෙව් 10:16-18 පදවලින් ඔබට මතක්කර දීමට අවශ්‍යයී:

> ❤"ඒ දවස්වලට පසුව මා විසින් ඔවුන් සමඟ කරන ගිවිසුම (ප්‍රඥාප්තිය) නම්, මාගේ ව්‍යවස්ථාව ඔවුන්ගේ සිත්වල

> තබා, ඒවා ඔවුන්ගේ සිහියේ (අභ්‍යන්තර සහ තේරුම්ග ැනීමේ) ලියන්නෙමියි ස්වාමීන්වහන්සේ කියන සේකැයි කී පසු, උන්වහන්සේ කථාකොට:
>
> ඔවුන්ගේ පාපවල් සහ අධර්මිෂ්ඨකම් තවත් සිහි නොකරන්නෙමියි කියන සේකී
>
> ඉදින් ඒවාට කමාව (පාප සමාව සහ දඬුවම නැති කිරීම) තිබෙන තැන, පාපය (පාප සහ නීති කැඩීම) ගැන පූජා ඔප්පු කිරීමක් තවත් නැත."

වෙනත් වචනයකින් කිවහොත්, ඔබගේ පාප සියල්ල සම්පූර්ණයෙන්ම දඬුවමද සමඟින් අවලංගු කළේයි යේසුස්වහන්සේ විසින් පරිපූර්ණ සහ සම්පූර්ණ කරන ලද මහත් ක්‍රියාව නිසා ඔබගේ පාපය උදෙසා ඔබට කළ හැකි කිසිවක් නැත් දැන් ඔබ විසින් දෙවියන්වහන්සේව ප්‍රසන්න කළ හැකි එකම දෙය වනුයේ, දෙවියන්වහන්සේ විසින් ඔබට නොමිලේම ලබාදීමට අවශ්‍යව ඇති එය ඇදහිල්ලේන් පිළිගැනීම පමණී.

හෙබ්‍රෙව් 10:19, 20 පද යේසුස්වහන්සේ පිළිබඳව කථාකරමින් පවසනුයේ, උන්වහන්සේගේ යාගය කරණකොටගෙන ❤"නැවුම් (අලුත්) සහ ජීවන මාර්ගයක්" විවෘතකරදී ඇති අතර, උන්වහන්සේගේ රුධිරයෙන් ❤"බලය සහ සුචරිතය" ලැබ නිදහසෙන් සහ විශ්වාසයෙන් යුතුව උන්වහන්සේගේ අභිමුඛයට ඇතුළුවීමයි.

දැන් දෙවියන්වහන්සේවත් ඔබවත් වෙන් කරනු ලබන තීරණයක් තවදුරටත් නැත.

එය මොනතරම් උත්කෘෂ්ඨවත් පණිවුඩයක්ද ණී.

ඔබගේ පාප සියල්ල අවලංගු කොට, ඉවත්කර සහ අමතකකර දමා ඇති බැවින් දැන් ඔබට නිර්භීතව පැමිණ දෙවියන්වහන්සේ සමඟ සහභාගිකම පැවැත්විය හැකියි.

ප්‍රීතිමත්වන්නණී ක්‍රිස්තුස්වහන්සේ තුළ ඔබ දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකමයි (2 කොරින්ති 5:21).

# 4
# ඔබගේ අනාගතයට

ඔබ පිළිබඳව ඔබටම බියක් ඇත්තේ ද ?

"බිය නොවන්න මා දරුව" යන ගීතයේ ස්වාමීන්වහන්සේ මේ වචන කථා කරයි:

"බිය නොවන්න මා දරුව
සැමවිටම මම ඔබ සමඟයි
ඔබේ වේදනාව
සහ ඔබගේ කඳුළු මට පෙනේ
බිය නොවන්න මා දරුව
සැමවිටම මම ඔබ සමඟයි
මා සතු දෙයින්
ඔබ රැකබලා ගැනීමට
කෙසේදැයි මා දන්නෙමි"[1]

[1]තැදළු හදළු ඨ පදමාලාව සහ සංගීතය කාමන් යී 1985 -ිදපැ - ද් ෘළු පම්සජ (පරිපාලනය ෘහිචරසබට පම්සජල ් ාසබිසදබ ඉහ උදරා සබජ ) ඊළුෂ

2 තිමොති 1:7 පදයෙන් පාවුල් ඔහුගේ යෞවන ගෝලයාට මහත් ඕනෑකමකින් කියා සිටිනුයේ, තම සේවය නොබියව ක්‍රියාත්මක කරන මෙන්යි ❤“මක්නිසාද දෙවියන්වහන්සේ අපට දුන්නේ බයාදුකමේ (බියසුලු, පහත්, බියෙන් තැවෙන සහ බියෙන් යුතුව අධිකව යටහත් පහත්වීම) ආත්මයක් නොව (උන්වහන්සේ අපටදී ඇත්තේ) බලයෙත් ප්‍රේමයෙත් හික්මවීමේ ආත්මයක්යි,”

ඒ පදය මතක තබාගන්නී එය කටපාඩම් කර, ඔබ කාන්සාවට සහ බියටපත් කරවමින් ඔබව පරීක්ෂාවට හසු කරගැනීමට උත්සහ කරන සැමවිටම මෙය නැවත නැවත ප්‍රකාශ කරන්නී.

බිය දෙවියන්වහන්සේගෙන් නොවේයි ඔබගේ හදවත බියෙන් පිරවීමට අවශ්‍ය සාතන්ටයි දෙවියන්වහන්සේට ඔබ උදෙසාවු සැළස්මක් ඇති උන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල තබා උන්වහන්සේගේ ඒ සැළැස්ම ලබාගන්නී නමුත් සාතන්ටද ඔබ ජීවිතය උදෙසාවු සැළැස්මක් ඇති බව මතක තබාගන්නී බිය කරණකොටගෙන ඔහුගේ ඒ සැළැස්ම ඔබ ලබන්නේයී.

ගීතිකාකරු වන දාවිත් මෙසේ ලියා ඇති ❤“ස්වාමීන් සෙව්මි (විචාල) උන්වහන්සේ මට උත්තර දී (අවශ්‍යතාවය සහ උන්වහන්සේගේ වචනයේ අධිකාරිත්වය) මාගේ සියලු භයින් මා මිදූ සේක.”

යේසුස්වහන්සේ ඔබගේ මිදුම්කරුවාණෝයි ඔබ උන්වහන්සේව අප්‍රමදව සොයන්නේ නම්, උන්වහන්සේ ඔබව සියලු භයින් මුදවන සේකී යොහන් 14:27 පදයෙන් උන්වහන්සේ තමන්ගේ බියෙන් සිටි ගොලයන්ට මෙසේ පැවසූ සේකී ❤“නුඹලාගේ සිත් කැළඹෙන්නටවත් භයවෙන්ටවත් නොදෙල්ලා (කැළඹෙන්ට, බධාවීමටධ ඔබ බියට පත්වීමට සහ බිය ගුළුවීමට, තැතිගැනීමට සහ කලබලයට පත්වීමට ඉඩ නොදෙන්නී.”

මින් අදහස් කරනුයේ, ඔබ බියට එරෙහිව ආක්‍රමණශීලිව කටයුතු කළ යුතු බවයී ඔබව තැති ගැන්වීමට හෝ ඔබගේ ජීවිතය පාලනය කිරීමට බිය ගෙනෙන්නාවු ආත්මයට ඉඩක් නොතැබීම පිණිස අදම තීරණය ගන්නී.

ගීතාවලිය 56:3, 4 පදවලින් දාවිත් ස්වාමීන්වහන්සේ පිළිබඳව කථාකරයිඃ

❤"මට භය ඇති කල්හි මම ඔබ කෙරෙහි විශ්වාස කරන්නෙමි.

මම දෙවියන්වහන්සේ තුළ (උපකාරයෙන්) උන්වහන්සේගේ වචනය වර්ණනා කරන්නේමි දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබා සිටිමි, භය නොවන්නෙමිධ මාංසමයවූ මනුෂ්‍යයා මට කුමක් කරයිද?"

යෙසායා 41:10 පදයෙන් උන්වහන්සේ තම සෙනඟට මෙසේ සහතිකයක් දේ ❤"භය නොවන්න (භයවීමට කිසිවක් නැත) මක්නිසාද මම නුඹ සමඟ සිටිමිධ තැති නොගනින්න, මක්නිසාද මම නුඹේ දෙවියන්වහන්සේයි මම නුඹ ශක්තිමත් කොට, නුඹට උපකාර කරන්නේමිධ එසේය, මාගේ ධර්මිෂ්ඨකම නැමැති (විජයග්‍රහණයේ) දකුණතින් නුඹ උසුලන්නෙමි."

හෙබ්‍රෙව් යැවුම් පත්‍රයේ 13:5 පදයෙන් කතුවරයා භූමික වස්තුව සහ ආරක්ෂා පිළිබඳව අනතුරු හඟවමින් මෙය අපට මතක් කර දේඃ ❤"මක්නිසාද මම කිසිසෙත් නුඹෙන් අහක්ව නොයමි (මම නොයමි) (මම නොයමි) (මම නොයමි) කිසි අන්දමකින්වත් නුඹ (ඔබව) අත් නොහරිමියි (විශ්‍රාමව තබන්නෙමි) උන්වහන්සේම (දෙවියන්වහන්සේ) කියා තිබේ,"

ඉන් අනතුරුව 6 වන පදයෙන් ඔහු තවදුරටත් පවසනුයේ, ❤"ස්වාමීන්වහන්සේ මාගේ උපකාරයාණෝයධ මම භය නොවන්නෙමි (මම බිය නොවන්නෙමි, හෝ තැති නොගන්නෙමි හෝ බිය ගැනීමට භය නොවන්නෙමි)ධ මනුෂ්‍යයා මට කරන්නේ කුමක්ද? කියා මහත් ධෛර්‍යයෙන් යුක්තව කියමුවි."

ත්ර (බිය) යන ඉංග්‍රිසි වචනය තුළ ඇති මේ එක් එක් අකුර සඳහා ආර්ථයක් මෙසේ දැක්විය හැකි ජ-ේකිැ (බොරු) ැ-ඩසාැබජැ (සාක්ෂි) ﾍﾍ-චචැරසබට (ප්‍රකාශවනුයේ) ඍ-රැක (සත්‍යය) (බොරු සාක්ෂි ප්‍රකාශ කරනුයේ සත්‍ය ආකාරයටයි) ඔබ දැනට ගත කරනු ලබන තත්ත්වය ඔබගේ අනාගතයේ අසාර්ථකත්වය ඔබට ඒත්තු ගැන්වීම

යක්ෂයාට අවශ්‍යයි නමුත් බයිබලය අපට උගන්වනුයේ, පවත්නා වර්තමාන තත්ත්වය කුමණාකාර වුවත්, කෙතරම් එය අයහපත්ව දක්නට ලැබුණත්, දෙවියන්වහන්සේට නොහැකි යැයි කිසිවක් නැති (මාර්ක් 9:17-23).

යෙසායා 41:13 පදයෙන් අපට මෙසේ පවසයි, ❤"මක්නිසාද නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ වන මමඃ භය නොවන්න, මම නුඹට පිහිටවන්නෙමියි කියමින් නුඹේ දකුණත අල්ලන්නෙමී." අයහපත ගැන දැනගන්නට ලැබුණු පමණින් ඔබ බියවිය යුතු නැති බව මින් අදහස් කෙරේ දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස තබන්නී සියලු දේ එකට ඔබගේ යහපත පිණිස ක්‍රියා කරවීමට උන්වහන්සේට හැකියි

රෝම 8:28 පදයෙන් අපෝස්තුළුවර පාවුල් අපට මතක්කර දෙනුයේ, දෙවියන්වහන්සේට ප්‍රේමකරන සියල්ලන්ට එනම් උන්වහන්සේගේ සැළසුමට සහ අරමුණට අනුව කැඳවුවන්ට යහපත පිණිස සියල්ල එකට සිදුවන බවයි.

යෙසායා 43:1-3 පදවලින් අපට මෙසේ පවසයි ❤"එම්බා යාකොබ්, නුඹ මැව්වාවූද එම්බා ඉශ්‍රයෙල්, නුඹව සෑදුවාවූද ස්වාමීන්වහන්සේ මෙසේ කියන සේක් භය නොවන්නී මක්නිසාද මම නුඹ මුදාගතිම්ධ නුඹේ නම කියා හඬ ගැසීමී නුඹ මාගේයි නුඹ විලමැදින් යනවිට මම නුඹ සමඟ සිටින්නෙම්ධ නුඹ ගංගා මැදින් යනවිට ඒවා නුඹට උඩින් ගලායන්නේ නැති නුඹ ගිනි මැදින් යනවිට නොදැවෙන්නෙහියධ ගිනි දැල්ල නුඹ කෙරෙහි නොදැවිළෙන්නේයි මක්නිසාද මම නුඹ දෙවි වූ ස්වාමීන්වහන්සේය, නුඹේ ගැළවුම්කාරයාවන ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනැන්වහන්සේයි."

බිය පිළබඳව වූ මේ ශුද්ධ ලියවිලි කොටස් ශබ්දනඟා කියවීමට ඉගෙනගන්නී ඔබ හුදකලාවේ සිටිනා පරිසරයක හිදිනා විට ශබ්දනඟා ප්‍රකාශ කරන්නී තමන් බියෙන් තොරව ජීවත් වන්නේ යයි ඔබගේ ආත්මීකත්වය තුළ ස්ථාපිත කරගන්නී දෙවියන්වහන්සේගේ වචනය ප්‍රකාශ කරමින්, ඔබ සිත් පීඩාවලින් යුත්, ජීවත් නොවන බව යක්ෂයාට දැනගන්නට සලස්වන්නී.

බිය සිත්පීඩා ඇතිකරන බව බයිබලය පවසන බව මතක තබාගන්නී (1 යොහන් 4:18) යේසුස්වහන්සේ මරණයට පත්වුයේ අපව සිත් පීඩාවෙන් මුදවාගැනීමටයි එපීස 3:12,13 පදවලින් පාවුල් පවසනුයේ, යේසුස්වහන්සේ කෙරෙහි වු අපගේ ඇදහිල්ල කරණකොටගෙන,

❤"ක්‍රිස්තුස්වහන්සේ තුළ අපේ ඇදහිල්ල කරණකොටගෙන නිර්භීතකමත් (ධෛර්‍යමත්කම සහ විශ්වාසය), සැක නැතුව ළංවෙන්නට (නිදහසේ සහ බියෙන් තොරව පූර්ණව දෙවියන්වහන්සේ වෙතට ළංවීම) පුළුවන්කමත්,

උන්වහන්සේ තුළ අපට තිබේ එහෙයින් නුඹලාගේ ගෞරවයට හේතුවු, නුඹලා නිසා මා විඳින්නාවු දුක්ගැන ක්ලාන්ත නොවන (සිහිනැති නොවී හෝ බියෙන් බියෙන් දොම්නසට පත්නොවී) ලෙස ඉල්ලමී."

ගීතාවලිය 46:1,2 පදවලින් අපට මෙසේ මතකයට ගෙනේ:

❤"දෙවියන්වහන්සේ අපේ සරණ හා ශක්තිය (ඉතා බලවත් සහ පරීක්‍ෂාවන්ට විනිවිඳ යා නොහැකි) දුකේදී ඉතා ළංවු පිහිටක්යීග

එබැවින් පොළොව වෙනස් වෙතත්, මූහුද මැද පර්වත සැලෙතත්."

යොෂුවා පොතේ පළමු පරිච්ඡේදය තුළ දෙවියන්වහන්සේ යොෂුවාව ධෛර්‍යමත් කරන පිණිස, ❤"ශක්තිමත්ව (විශ්වාසයෙන් යුතුව) ධෛර්‍යමත්ව සිටපන්න," නැවත නැවත ප්‍රකාශ කරමින්, ❤"නුඹ යන සෑම තැන්හිම නුඹේ දෙවිවු ස්වාමීන්වහන්සේ නුඹ සමඟ සිටින සේකැයි කී සේක," යනුවෙන් සහතිකයක්ද දුන් සේකී එබැවින්, ඔබට බියවීමට අවශ්‍යතාවයක් නැතී දෙවියන්වහන්සේ ඒ පණිවුඩය ප්‍රකාශ කළේ යොෂුවාට පමණක් නොව ඒ ඔබටත්යි.

දෙවියන්වහන්සේ ඔබ සමඟයි උන්වහන්සේ ඔබ කෙරෙන් ඉවත්ව යන්නේ හෝ අත්හැර යන්නේ හෝ නැත (හෙබ්‍රෙව් 13:5) උන්වහන්සේගේ ඇස් සැමවිටම ඔබ කෙරෙහියි (ගීතාවලිය 33:18) ඔබගේ රූපය උන්වහන්සේගේ අත්ලේ කොටා ඇත (යෙසායා 49-16) එබැවින් ඔබට බියවීමට අවශ්‍ය නැත ශක්තිමත්ව, විශ්වාසව, සම්පූර්ණයෙන්ම ධෛර්යමත්ව සහ බිය නොවී සිටින්න.

කන්ද උඩ දේශනාවේ, මතෙව් 6:34 පදයෙන්, යේසුස්වහන්සේ තම අනුගාමිකයන්, ❤"එබැවින් හෙට දවස ගැන කනස්සලු නොවෙල්ලා හෙට දවස ඒ ගැනම කරදරවන්නේ දවසේ කරදරය ඒ දවසට සෑහෙයි" යනුවෙන් ඉගැන් වූ සේක.

මතෙව් 8:23-27 පදවලින් අපොස්තුළුවරුන් කණගාටුවූ අවස්ථාවේදී බියෙන් තැතිගත් ආකාරය අපි කියවා ඇත්තෙමු ❤"මද ඇදහිල්ල ඇත්තෙනි, කුමක් නිසා භයපත්වව්දැයි ඔවුන්ට කියා, නැඟිට සුළඟටත් මුහුදටත් සැරකළ සේක එවිට මහත් නිශ්චලයක් (මහත් ශාන්තභාවයක්) විය."

ලූක් 12:25, 26 පදවලින් යේසුස්වහන්සේ මෙසේ අසයි, ❤"කණස්සලුවීමෙන් තමාගේ උසට එක රියනක්වත් වැඩි කරගන්නට නුඹලා අතරෙන් කවරෙකුට පුළුවන්ද? ඉදින් සුළු දෙයක්වත් කරගන්නට නුඹලාට බැරිනම්, නුඹලා අනිත් කාරණා ගැන කණස්සලු වන්නේ මක්නිසාද?"

යෙසායා පොතේ 54 වන පරිච්ඡේදයේ 4-5 පදවලින් ❤" බිය නොවන්න" යනුවෙන් පවසමින්, "භය නොවන්න, නුඹ ලැජ්ජාවට පැමිණෙන්නේ නැත නොකැළඹෙන්නඩ නුඹ තීන්දුවට නොපැමිණෙන්නෙහියි මක්නිසාද නුඹ නුඹේ යෞවන කාලයේ ලැජ්ජාව සිහි නැතිකරන්නේහිය, නුඹේ වැන්දඹුකමේ තීන්දුවද තවත් සිහි නොකරන්නෙහියි කුමක් හෙයින්ද? නුඹේ ස්වාමි පුරුෂයා නම් නුඹේ මැවුම්කරුවාණෝයඩ උන්වහන්සේගේ නාමය සේනාවල ස්වාමීන්වහන්සේයි නුඹේ මිදුම්කාරයාණෝ ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනැන්වහන්සේයඩ මුළු පොළොවේ දෙවියන්වහන්සේ යයි උන්වහන්සේට කියනු ලැබේ."

යෙසායා 35:4 පදයේ අප මෙසේ කියවා ඇති ❤"භය සිත් ඇත්තන්ට කථාකොට භය නොවී ශක්තිමත් වෙයල්ලී බලව, නුඹලාගේ දෙවියන්වහන්සේ පළිගැනීම වන දෙවියන්වහන්සේගේ විපාක දීම ඇතුව එන සේකඩ උන්වහන්සේම ඇවිත් නුඹලා ගළවන සේකැයි කියාපල්ලී."

බියට යටත්වීමේ පරීක්ෂාවෙන් ජයගැනීම පිණිස උන්වහන්සේගේ ශක්තියෙන් සහ බලයෙන් ඔබගේ අභ්‍යන්තර මනුෂ්‍යයාව පූර්ණ ලෙසින් ශක්තිමත් කරන්නැයි දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්නී (එපීස 3:16).

බිය සම්බන්ධව දෙවියන්වහන්සේ විසින් මට දෙන ලද එළිදරව් කිරීමක් මේ මොහොතේ ඔබ සමඟ බෙදාගන්නට කැමැත්තෙමී ස්වාමීන්වහන්සේ උන්වහන්සේගේ වචනයෙන් කථා කරනවිට, උන්වහන්සේ ❤"භය නොවන්න" යයි පවසයී නමුත් ඉන් අපට අණ කරනුයේ බිය සම්බන්ධව හැඟීමක් නොමැතිව සිටීමට නොවේයී ඇත්තෙන්ම උන්වහන්සේ අපට පවසනුයේ, "ඔබට බිය හැඟෙනෙවිට, හැරී ඉන් පළායාම නොකරන්නී මන්ද, යක්ෂයා අපට පහර දෙන අවස්ථාව එය බැවිනී ඒ වෙනුවට, ඔබ තුළ බිය තිබුණත් ඉදිරියට ගමන් කරන්නී."

අවුරුදු ගණනාවක් පුරා, මට බිය හැඟෙන විට මා සිතුවේ මා බියගුල්ලෙකු ලෙසටයී නමුත් බිය පරාජය කර විජයග්‍රහණය කරනුයේ ඊට මුහුණට මුහුණ එරෙහිව හිඳිමෙන් බව දැන් මම ඉගෙනගෙන සිටින්නෙමී එය මුහුණට මුහුණ සටනකී එසේම ඍජුව ගැටීම, සහ ඒ උදෙසා ඉක්මනින් කටයුතු කිරීමක්යී දෙවියන්වහන්සේ ඔබට පවසා ඇති ඕනෑම දෙයක් බියෙන් සිටින වේලාවකදී වුවද එය ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත්වේ

ලිවිං බයිබල් අනුවාදයට අනුව ගීතාවලිය 34:4 පදයෙන් දාවිත් මෙසේ පවසයී ❤"මක්නිසාද මම මොරගැසීමී උන්වහන්සේ පිළිතුරුදී, මාගේ සියලු භයෙන් මා නිදහස් කළ සේකී" එසේම යොහන් අපට මෙසේ මතකයට ගෙනේ "ප්‍රේමයෙහි භය ඇත්තේ නැත (තැති ගැනීම පවතින්නේ නැතී සම්පූර්ණ ප්‍රේමය (සම්පූර්ණ සහ පරිපූර්ණ) භය දුරු කරයි, මක්නිසාද භය දඬුවමින් යුක්තයඩ (එබැවින්) භයවන තැනැත්තේ ප්‍රේමයේහි සම්පූර්ණ (සම්පූර්ණ සහ පරිපූර්ණ) නොවී සිටියී."

දෙවියන්වහන්සේ ඔබට ප්‍රේම කරන බව මතක තබාගන්න ණී සහ සම්පූර්ණ ප්‍රේමයකින් උන්වහන්සේ ඔබට ප්‍රේමකරන සහ රැකවරණය දෙන බැවින් ඔබට බියෙන් තොරව ජීවත්වීමට නිදහස ඇත්තේයී.

සමහරවිට මේ මොහොතේ වනවිට ඔබට බොහෝ සෙයින් බියෙන් යුක්තව ඇති බැවින් බියෙන් තොරව නිදහසේ ජීවිතය ගතකිරීම සැබෑ නොවන භීතයක තත්ත්වයට පත්ව ඇතී එසේ නම්, ඔබ විසින් මතකයට ගෙන ආ යුතු දෙයක් ඇතඨ ඔබගේ ඕනෑම සහ සියලු ප්‍රශ්ණවලින් උන්වහන්සේට එක්වරම ඔබව නිදහස් කළ හැකි වුවද, දෙවියන්වහන්සේ ඔබව නිදහස් කරනුයේ ක්‍රමානුකූලවයී එබැවින්, දෙවියන්වහන්සේ ඔබ තුළ ක්‍රියා කරන බැවින් ධෛර්‍යමත්ව ඉන්නී දෙවියන්වහන්සේ යහපත් ක්‍රියාවක් ඔබ තුළ ආරම්භ කර ඇති අතර උන්වහන්සේ එය සම්පූර්ණ කරන සේකී (පිලිප්පි 1:6).

ගීතාවලිය 27:1 පදයෙන් එහි කතෘ මෙසේ ප්‍රශ්ණ කරයී ❤"ස්වාමීන්වහන්සේ මාගේ ආලෝකයත් ගැළවීමත්යඨ මම කාට භයවෙම්ද? ස්වාමීන්වහන්සේ මාගේ ජීවිතයේ ශක්තියයඨ මම කාට භීතවන්නෙම්ද තවදුරටත් ඔහු මෙසේ පවසයී නපුරුකම් කරන්නෝ එනම් මාගේ එදිරිකාරයන් හා සතුරෝ මාගේ මාංශය කන පිණිස මට විරුද්ධව ආ කල පැකිල වැටුණෝයී සේනාවක් මට විරුද්ධව කඳවුරු බැන්දත්, මාගේ සිත භය නොවන්නේයී මට විරුද්ධව යුද්ධයක් හට ගත්තත්, එකල්හී මම සුරක්ෂිතව සිටින්නේමී."

එම පරිච්ඡේදයම 5 සහ 6 පදවලින් දාවිත් ප්‍රකාශ කර සිටිනුයේ, කරදර ඔහු කරා පැමිණි කල දෙවියන්වහන්සේ තමන්ව වසා ගන්නා බවයී ඔහුගේ සතුරන්ට ඔහු අසු නොවන පිණිස, උන්වහන්සේ පර්වතයක් පිට ඔහුව තබන බවත්, ඉන්පසු ඔහු තමන්ගේ ස්වාමීන්වහන්සේට යාගයක් ඔප්පු කරමින් උන්වහන්සේට ප්‍රශාංසා ගී ප්‍රීතියෙන් ගායනා කරන බවත් පැවසුවේයී.

දාවිත් රජ වෙනුවෙන් දෙවියන්වහන්සේ යම් දෙයක් කළේද, එය ඔබගේ ජීවිතයටද උන්වහන්සේ කරන සේකී ස්වාමීන්වහන්සේ කෙරෙහි

ඔබගේ විශ්වාසය තබනන්නී සියලු බියෙන් මුදවා ගැනීමේ බලය උන්වහන්සේ සතුයි.

ස්වාමීන්වහන්සේගේ දූතයා දානියෙල්ට පැවසූ මේ වචනවලට ඇහුම්කන් දෙන්නී ඔහු මෙය පවසනුයේ උන්වහන්සේ නිෂ්චිතවම ඔහුගේ යාච්ඤාවලට පිළිතුරු දෙන බව ධෛර්යයෙන් යුතුවයි "දානියෙල් භය නොවන්නී මක්නිසාද නුඹ තේරුම්ගන්ටත් නුඹේ දෙවියන්වහන්සේ ඉදිරියෙහි යටත්වෙන්ටත් නුඹේ සිත යොමු කරගත් පළමු වෙනිදා සිට නුඹේ වචන ආපසු ලැබීයී මමද නුඹේ වචන නිසා (ප්‍රතිචාරය දැක්වීමට) ආවෙමි."

දෙවියන්වහන්සේ විසින් ඔබගේ යාච්ඤාවන් ඇසූ නැති බවත් සහ අසන්නේ නැති බවත් යක්ෂයා ඔබට පැවසීමට උත්සහ කරන්නේයී ආත්මයාණන්වහන්සේගේ කඩුව දෙවියන්වහන්සේගේ වචනය බව මතක තබාගන්නී (එපීස 6:17) වචනයේ කඩුවෙන් සතුරාව පරාජය කරන්නේයී ඔබගේ හදවත තුළ මේ ශුද්ධ ලියවිලි කොටස් සඟවාගෙන, දිවා රෑ ඒවා මෙනෙහි කරන්නී.

ඔබට සතුරාව පරාජය කළ හැක්කේ දෙවියන්වහන්සේගේ වචනය භාවිතයෙන් පමණී සාතන්ගේ බොරු ඔබට හඳුනාගත හැකිවන්නේ ඔබ දෙවියන්වහන්සේගේ වචනය දන්නේ නම් පමණී දෙවියන්වහන්සේගේ වචනය ප්‍රකාශකරන්නී එය ඔබව ජයග්‍රාහි ස්ථානයට ගෙනෙන්නේයී.

ඔබට ඉහළින් සිටිය කෙනෙකු සම්බන්ධව කථාකිරීමට සමහරවිට ඔබ බියක් දක්වනවා විය හැකී සමහරවිට ඔබ චූතයෙකුව සිටින අතර ඔබගෙ ම ආරක්ෂාව උදෙසා ඔබ ප්‍රකාශ කළ යුත්තේ කුමක්දැයි ඔබ සැලකිල්ලෙන් සිටිනවා වියහැකී ලූක් 12:11,12 පදවලින් යේසුස්වහන්සේ විසින් පවසන ලද වචනවලට ඇහුම්කන් දෙමු ❤"ඔවුන් සිනගෝගවලටද ප්‍රධානීන් සහ ආණ්ඩුකාරයන් ඉදිරියටද නුඹලා ගෙනයන කල උත්තර දෙන්නේ කෙසේද කියාත් සිතා කණගාටු නොවෙල්ලී මක්නිසාද නුඹලා විසින් කිය යුතුදේ ඒ පැයේදීම ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලාට උගන්වනවා ඇතැයි කී සේකී බියට යටත්වීමට ඔබ පෙළඹෙන විට ගීතාවලිය 23:1-6 ස්වාමීන්වහන්සේ කෙරෙහිවූ ඇදහිල්ල උන්වහන්සේ සැපයිම

සහ උන්වහන්සේගේ රැකවරණය ප්‍රකාශ කිරීම උදෙසා ගීතාවලිය 23:1-6 නැවත නැවත පවසන්නී."

❤"ස්වාමින්වහන්සේ මාගේ එඬේරායඛ මට හිඟයක් නොවන්නේයී

උන්වහන්සේ නිල් ගොදුරු බිම්වල මා ලඟින්ට සලස්වන වන සේකී නිශ්චල වු දිය අසලින් මා ගෙනයන සේකී

උන්වහන්සේ මාගේ ආත්මය ප්‍රාණවත් කරන සේකඛ ස්වකීය නාමය නිසා ධර්මිෂ්ඨකමේ මාවත්වල මා ගෙනයන සේකී

එසේය, මරණ සෙවණේ මිටියාවත මැදින් යන්නෙම් නමුත්, කිසි උපද්‍රවයකට භය නොවන්නෙම්ඛ

මක්නිසාද ඔබ මා සමඟයී ඔබගේ දණ්ඩෙන් හා සැරයටියෙන් මට සැනසිල්ල ලැබේ

මාගේ සතුරන් ඉදිරියෙහි ඔබ මට කෑම මේසයක් පිළියෙළ කරන සේකී

මාගේ හිස තෙලින් ආලේප කළ සේකඛ

මාගේ කුසලාන උතුරා යයී

සැබැවින්ම යහපත්කමත් කරුණාවත් මගේ ජීවිතයේ සියලු දවස්වල මා අනුව එන්නේයී

මම සදාකල්ම ස්වාමීන්ගේ ගෘහයෙහි වාසය කරන්නෙමී.

# නිගමනය

නොසැලී සිටින්න ණී, දෙවියන්වහන්සේගේ ප්‍රේමය පිළිබඳවත් ඔබ වෙනුවෙන් සැළසුම් කරන ලද මහිමවත් අනාගතයත්, ක්‍රිස්තුස්වහන්සේ තුළ ඔබගේ ධර්මිෂ්ඨකමත් සහ බියෙන් නිදහස්වීම පිළිබඳවත් වු ශුද්ධ ලියවිලි කොටස් මේ කෘතයෙන් ඔබ සමඟ බෙදාගැනීමට කැමැත්තෙමි.

මේ කෘතියේ ඇතුළත්කර ඇති පොරොන්දු ඇතුළත් මේ ශුද්ධ ලියවිලි කොටස් ස්වාමීන්වහන්සේගේ සේවයකු ලෙස ඔබට හිමි උරුමයකී කෙසේ වුවද, යක්ෂයා විසින් එය ඔබගෙන් උදුරාගැනීමට සිටින බව ඔබ දැනගෙන සිටිය යුතුවු දෙයකී ඔබ නැවත වහල් භාවයට හැරි යාම දැකීම ඔහුගේ අවශ්‍යතාවයකී

එබැවින්, ගලාති 5:1 පදයෙන් පාවුල් අපට මෙසේ පවසයී ❤“ක්‍රිස්තුස්වහන්සේ අප මුදාගත්තේ නිදහස්කම ඇතුව සිටීමටයී එබැවින් දාසකම නැමැති වියගහකට නැවත අසු නොවී ස්ථිරව සිටපල්ලා.”

ජයග්‍රාහි කිතුණු ජීවිතයට ඉතා ප්‍රධානම කාරණයන් වනුයේ ස්ථිරව සිටීම, ඉවසිල්ල සහ දරාගැනීමයී:

> ❤“එබැවින් මහත් විපාකයක් ඇත්තා වු නුඹලාගේ නිසැකකම අත් නාරිල්ලී මක්නිසාද දෙවියන්වහන්සේගේ

කැමැත්ත කළ පසු පොරොන්දුව ලබන පිණිස (පූර්ණව විඳින්න) නුඹලාට ඉවසිල්ල ඕනෑයි.”

හෙබ්‍රෙව් 10:35, 36

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ රුධිරයෙන් මිළදීගත්තාවූ දේ පූර්ණ ලෙසින් විඳීම අපගේ ස්වාර්ගීක පියාණන්වහන්සේට අවශ්‍යයි අධිෂ්ඨානපූරකවන්නී අත් නොහරින පිණිස ඔබ මේ දැන් තීරණයක්ගන්නී පහතින් දක්වා ඇති ශුද්ධ ලියවිලි කොටස් ඔබගේ ජීවිතයේ කොටසක් බවට පරිවර්ථනය වන තුරු ඒවා ප්‍රකාශකරන්නී.

දෙවියන්වහන්සේ සැමවිටම ඔබට ප්‍රේමකරන බවත්, උන්වහන්සේගේ වචනයේ ජීවනය ඇති බවත් මතකතබාගන්නී.

# ශුද්ධ ලියවිලි ප්‍රකාශනය

## හැඳින්වීම: දෙවියන්වහන්සේගේ වචනය

දෙවියන්වහන්සේ ස්වකීය වචනය එවා මා සුවකොට මාගේ විනාශවලින් මුදාහරිනසේක් (ගීතාවලිය 107:20).

දුෂ්ටයන්ගේ මන්ත්‍රණය අනුව නොයන්නාවූ (ඔවුන්ගේ උපදෙස්, සැළසුම් සහ අරමුණු), පව්කාරයන්ගේ මාර්ගයෙහි නොසිටින්නාවූ (නිස්කලංකව සහ විශ්‍රමව), නින්දාකරන්නන්ගේ ආසනයෙහි නොහිඳින්නාවූ (අවමන්කරන්නන්).

ස්වාමීන්ගේ ව්‍යාවස්ථාවෙහි (අණපනත්, මාර්ගෝපදේශයන්, දෙවියන්වහන්සේගේ ඉගැන්වීම්) ප්‍රීතිවන්නාවූ, උන්වහන්සේගේ ව්‍යාවස්ථාව රෑ දවල් මෙනෙහිකරන්නාවූ (මහත් උවමනාවකින් අධ්‍යනයේ යෙදීම) මම ආශිර්වාදලද්දෙක්මි (ප්‍රීතිමත්, වාසනාවන්ත, සමෘද්ධිමත් සහ අන් අයවලුන් ඊර්ෂ්‍යාකරන්නාවූ).

ඔහු දිය ඇළවල් ළඟ හිඳුවූ, (හොඳින් රැකබලාගන්නාලද) නියම කලට ඵල දෙන, නොමැලවෙන කොළ ඇති ගසක් හා සමාන වන්නේයි මා කරන සියල්ල (මේරුණු තත්ත්වයට පත්වේ) සඵලවේ (ගීතාවලිය 1:1-3).

---

*Note: The  author has personalized the confessions for the reader by paraphrasing the referenced Scriptures in first person.

(සටහන: මෙම ප්‍රකාශණයන් කියවන්නා හට පුද්ගලිකව අදාළකරග නිමින් ප්‍රකාශ කරන පිණිස කතෘගේ අනුවාදයක් ලෙසට මෙහි දී භාවිතාකොට ඇත්තේ ප්‍රථම පුරුෂ උක්තයක් ලෙසටයි). මේ ව්‍යාවස්ථා පොත මාගේ මුඛයෙන් පහනොවේවා, එහි ලියා තිබෙන සියල්ල කරන්ට බලාගන්න පිණිස රෑ දාවල් ඒ ගැන මෙනෙහි කරපන්නී එවිට මාගේ මාර්ගය සඵලවී මට ශුභ සිද්ධවන්නේයි (යොෂුවා 1:8).

නුමුත් ඒ වචනය ලෙස මා කරන පිණිස එය මට ඉතා ළංව මාගේ මුඛයේද මාගේ සිතේද තිබේ (ද්විතීය කථාව 30:14).

දෙවියන්වහන්සේගේ මුඛයෙන් නික්මෙන උන්වහන්සේගේ වචනයත් උන්වහන්සේ වෙතට හිස්ව හැරී නෑවිත් (බලාත්මක නොවී, නිෂ්ප්‍රයෝජන) උන්වහන්සේ කැමති දෙය සිදුකොට උන්වහන්සේ නියමකල කාරණය සඵලකරනවා ඇත (යෙසායා 55:11).

මම මුහුණ වැස්මක් නැතුව, ස්වාමීන්වහන්සේගේ තේජස කැඩපතකින් (දෙවියන්වහන්සේගේ වචනය තුළ) මෙන් දක්වමින්, ආත්මයාණන්වහන්සේ වන (මෙය පැමිණෙනුයේ) ස්වාමීන්වහන්සේ කෙරෙන් තේජසින් තේජසට එම ස්වරූපයට වෙනස්කරනු ලබමුවී (2 කොරින්ති 3:18).

ඔබගේ වචනය සත්‍යතාවයි මෙය මා අධ්‍යනය කරමින් මෙනෙහිකරනවිට, මා සත්‍යය දැනගන්නා අතර සත්‍යය මා නිදහස්කරන්නේයි (යොහන් 17:17, 8:32).

## පරිච්ඡේද 1: දෙවියන්වහන්සේගේ ප්‍රේමය

නුමුත් මට ප්‍රේමකළාවූ තැනැන්වහන්සේ කරණකොටගෙන මම මේ සියල්ලේදී අතිශයින් ජයගන්නෝවමුවී

මක්නිසාද මරණයටවත්, ජීවනයටවත්, දූතයන්ටවත්, අධිපතිකම්වලටවත්, දැන් පවතින දේවලටවත්, මතු පැමිණෙන දේවලටවත්, පරාක්‍රමවලටවත්.

උසටවත්, ගැඹුරටවත්, අන් කිසිම මැවිල්ලකටවත්, මගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් -වහන්සේ තුළ ඇත්තාවූ දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් අප වෙන්කරන්ට නොහැකිවන්නේයයි ඒකාන්තයෙන්ම දනිමි.

මක්නිසාද දෙවියන්වහන්සේ(උන්වහන්සේම) ස්වකීය ඒකජාතක පුත්‍රයාණන්(අද්විතීය) දෙන තරම් මට ප්‍රේමකළසේක් එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහගන්න(විශ්වාසකරන, වෙලීසිටින, මත යැපෙන) මා විනාශ නොවී(වැනසීයාම, මංමුළාවීම) සදාකාල ජීවනය(අමරණීයත්වය) ලබන පිණිසයි (යොහන් 3:16).

මක්නිසාද මම යේසුස්වහන්සේට ප්‍රේමවූ බැවින්ද ඔබවහන්සේ දෙවියන්වහන්සේ වෙතින් ආ බව විශ්වාස කළ බැවින්ද පියාණන්වහන්සේම (කරුණාවන්තව) මට ප්‍රේමවනසේක් (යොහන් 16:27).

මම යේසුස්වහන්සේගේ ආඥා පිළිගෙන රක්ෂාකෙරේද, මම(සැබවින්ම) ප්‍රේමකරන්නෙමි යේසුස්වහන්සේට ප්‍රේමකරන්නා උන්වහන්සේගේ පියාණන් විසින් ප්‍රේමකරනු ලබන්නේයි යේසුස්වහන්සේ (ද) මට ප්‍රේමකොට මට ප්‍රකාශවන්නෙමියි(එළිදරව්වී, පැහැදිලිව) කීසේක් (උන්වහන්සේ විසින් උන්වහන්සේව සහ උන්වහන්සේගේ යථාර්ථය මට පැහැදිලිව දකින්නෙමි) (යොහන් 14:21).

මම ප්‍රේමකරන්නේ උන්වහන්සේ පළමුකොට මට ප්‍රේමකළ නිසායි (1 යොහන්4:19).

දෙවියන්වහන්ස, ඔබගේ කරුණාගුණය කොපමණ අනර්ඝදණී මම ඔබගේ පියාපත් සෙවණෙහි ආරක්ෂාව ලබමි (ගීතාවලිය 36:7).

ස්වාමිනි, ඔබ මා විමසා බලා දැන ගත්සේක් ඔබ මාගේ හිඳීමද නැගිටීමද දන්නාසේක් දුරදීම මාගේ සිතුවිල්ල ඔබට තේරෙයි ඔබ මාගේ ගමනත් සයනයත් විමසා බලනසේක් මාගේ සියලු මාර්ග දනගෙන සිටිනසේක් මක්නිසාද, ස්වාමිනි, ඔබ මුළුමනින්ම නොදන්නාවූ කිසි වචනයක් මාගේ දිවේ නැත්තේයි ඉදිරියෙන්ද පස්සෙන්ද ඔබ මා වටකරමින්, ඔබගේ හස්තය මා පිට තැබූසේක් මෙවැනි ඥානය මට අතිශයින් පුදුමයඩ එය උසස්ය, ඊට ළඟාවෙන්ට නොහැකිවෙමිඔබගේ ආත්මය කෙරෙන් කොතැනට යන්නෙම්ද? ඔබ ඉදිරිනේ කොතැනට පලායන්නෙම්ද?

දෙවියන්වහන්ස, ඔබගේ සිතිවිලි මට කොපමණ අනර්ඝදණී ඒවායේ ගණන කොපමණ මහත්ද? ඒවා ගණින්නෙම් නම්වැලිවලටත් වැඩියි මම පිබිදෙන විටත් ඔහ සමග වෙමිණී (ගීතාවලිය 139:1-7).

එබැවින් ස්වාමීන්වහන්සේ මට කරුණාකරන්ට බලාසිටින (මහත් ඕනෑකමකින්) සේකී නුඹලාට අනුකම්පාකරන්ට නැගිටිනසේකී මක්නිසාද ස්වාමීන්වහන්සේ විනිශ්චයේ දෙවිකෙනෙක්යධ උන්වහන්සේ (උන්වහන්සේගේ ජයග්‍රහණය, ළැදියාව, ප්‍රේමය, සමාදානය, ප්‍රීතිය, අසමසම සහයකත්වය) ගැන (මහත් ඕනෑකමකින්) බලාසිටින මම වාසනාවන්තයෙක්මි (ප්‍රීතිමත්, වාසනාවන්ත, අන්වයවලුන් ඊර්ෂ්‍යාකරන්නාවූ) (යෙසායා 30:18).

නුඹලා අනාථව නාරින්නෙමි (සැප පහසුව නැති, හුදකලා, දුකටපත්, කාලකණ්නි, අසරණී නුඹලා වෙතට (නැවත) එමි(යොහන් 14:18).

මාගේ පියාද මවුද මා අත්හැරියෝය, නුමුත් ස්වාමීන්වහන්සේ මා පිලිගන්නසේක (උන්වහන්සේ මා උන්වහන්සේගේ දරුවෙකු ලෙසට හදා වඩාගන්නසේක) (ගීතාවලිය 27:10).

මාගේ ඇදහිල්ල(සැබැවින්ම) කරණකොටගෙන ක්‍රිස්තුස්වහන්සේ මාගේ සිත තුළ වාසයකරන (පදිංචිවීම, බැඳීසිටීම, ස්ථිරවාසස්ථානයකර ගැනීම) පිණිසත්, මම ප්‍රේමයෙහි මුල් ඇද පිහිටා සිට.

දෙවියන්වහන්සේගේ මුළු පූර්ණකමට පූර්ණවන පිණිස සියලු ශුද්ධවන්තයන් (දෙවියන්වහන්සේගේ බැතිමතුන්, ඒ ප්‍රේමය අත්විඳින්නාවූ) සමඟ ක්‍රිස්තුස්වහන්සේගේ දැනගත නොහැකි ප්‍රේමය දැනගෙන.

එහි දිග, පළල, උස, ගැඹුර කිමෙක්ද කියා තේරුම්ගන්ට (ප්‍රායෝගිකව, මගේම අත්දැකීම්වලින්) මට පුළුවන්වන (ඇත්තෙන්ම මට එසේවී ඇත) පිණිසත්, උන්වහන්සේගේ මහිමයේ සම්පතේ (දිව්‍යමය අභිමුඛය පූර්ණව මා සතුව ඇත, දෙවියන්වහන්සේම මාගේ ශරීරය තුළ පිරී ඉතිරි ගලන්නේයි) හැටියට මට (පූර්ණ ලෙසින්) දෙන මෙන් යාච්ඤාකරමී. (එපීස 3:17-19).

පියාණන්වහන්සේ යේසුස්වහන්සේට ප්‍රේමකළාක්මෙන්ම උන්වහන්සේත් මට ද ප්‍රේමකරමී මම උන්වහන්සේගේ ප්‍රේමයෙහි පවතින්නෙමී යේසුස්වහන්සේ උන්වහන්සේගේ ප්‍රේමය මට දක්වනුයේ මෙවැනි ප්‍රේමයකී එනම්, යමෙක් තමාගේ මිත්‍රයන් උදෙසා තමාගේ ජීවිතය දීමට වඩා මහත් ප්‍රේමයක් කිසිවෙකුට නැතී (යොහන් 15:9,13).

නුමුත් දෙවියන්වහන්සේ මා කෙරෙහි ඇති තමන්වහන්සේගේ ප්‍රේමය පෙන්වන්නේ මා පව්කාරයක්ව සිටියදීම මා වෙනුවට ක්‍රිස්තුස්වහන්සේ (මෙසියස්වහන්සේ, ආලේපලත් තැනැත්වහන්සේ) මරණය විඳීමෙන්යී (රෝම 5:8).

ඒ ප්‍රේමවන්තයාණන්වහන්සේ තුළ, උන්වහන්සේගේ කරුණාවේ සම්පතේ ප්‍රකාරයට ප්‍රකාරයට, උන්වහන්සේගේ ලේ කරණකොටගෙන මාගේ මිදීම වන මාගේ වරදවලට කමාව මට ඇත්තේයි (එපීස 1:7).

මක්නිසාද කඳු පහවයන්නේය, හෙල්ද සොලවනු ලබන්නේයඣ නුමුත් දෙවියන්වහන්සේගේ කරුණාව නම් මාගෙන් පහ නොවන්නේය, උන්වහන්සේගේ සමාදාන ගිවිසුමද සොල්වනු නොලබන්නේයයි මට අනුකම්පාකරන ස්වාමීන්වහන්සේ කියනසේකී (යෙසාසා 54:10).

දෙවියන්වහන්සේ විශ්වාසව සිටින සේකී(විශ්වාසය තැබියහැකි, විශ්වාසවන්ත, උන්වහන්සේගේ පොරොන්දු ඉෂ්ටකරන්නාවූ සහ මට උන්වහන්සේ මත යැපිය හැකී). (1 කොරින්ති 1:9).

මාගේ ආත්මය ස්වාමීන්ට ප්‍රශංසා (දයාබරව, කෘතඥතාවයෙන් පිරි ප්‍රශංසාව) කරවඣ මා තුළ(ගැඹුරින්ම) ඇති සියල්ල උන්වහන්සේගේ ශුද්ධවූ නාමයට ප්‍රශංසා කරවී.

මාගේ ආත්මය, ස්වාමීන්ට ප්‍රශංසා කරව (දයාබරව, කෘතඥතාවයෙන් පිරි ප්‍රශංසාව), උන්වහන්සේගේ උපකාර සියල්ල (එකක්හෝ නැර) සිහිනැති නොකරවී.

උන්වහන්සේ මාගේ සියලු අයුතුකම් (සෑම එකක්ම) කමාකරනසේකඣ මාගේ සියලු රෝග (එකිනෙක) සුවකරනසේකඩ,

මාගේ ජීවිතය විනාශයෙන් මුදා කරුණාගුණය හා දයාව නමැති ඔටුන්නෙන් මා සරසන සේක් (ගීතාවලිය 103:1-4).

රාජාලියෙකු මෙන් තාගේ යෞවනකම අලුත් වන පිණිස උන්වහන්සේ තාගේ කට යහපත් දෙයින් තෘප්තියට පමුණුවනසේක්.

ස්වාමීන්වහන්සේ පීඩා විඳින සියල්ලන් උදෙසා ධර්මිෂ්ඨ ක්‍රියා හා යුක්තිය ඉෂ්ටකරනසේක්. ස්වාමීන්වහන්සේ අනුකම්පාවෙන් හා දයාවෙන් පිරී සිටිනසේක, කෝපවීමට ප්‍රමාදය, අතිශයින් කරුණාවන්තයි. උන්වහන්සේ නිතර තරවටු නොකරනසේකඩ සදාකාලයට කෝපය නොපවත්වනසේක්. මක්නිසාද පොළොවට උඩින් අහස උස්ව තිබෙන්නාක්මෙන් උන්වහන්සේ කෙරෙහි භය ඇත්තන්ට උන්වහන්සේගේ කරුණාව මහත්යි. නැගෙනහිර බස්නාහිරෙන් දුරුව තිබෙන්නාක්මෙන් උන්වහන්සේ මාගේ වරද මාගෙන් දුරු කළසේක්. මම උන්වහන්සේට ගෞරවය කළ බැවින්, උන්වහන්සේ මට පියෙක් මෙන් මට මෘදුකමින් අනුකම්පා කළසේක්.

නුමුත් ස්වාමීන්වහන්සේගේ කරුණාව තමන්ට භය ඇත්තන් කෙරෙහි සදාකාලයෙන් සදාකාලයටද, උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම දරුවන්ගේ දරුවන්ට පවත්නේයි. (ගීතාවලිය 103:5, 6, 8, 9, 11-13, 17). නුමුත් කෙරෙහි විශ්වාස කරන තැනැත්තේ කරුණාවෙන් වටකරනු ලබන්නේයි. (ගීතාවලිය 32:10).

සෑම කල්හිම ස්වාමීන්ට ප්‍රශංසා කරමි උන්වහන්සේගේ වර්ණනාව මාගේ මුඛයෙහි නිතරම පවත්නේයි.

මාගේ ආත්මය ස්වාමීන්ගේ ගුණ වර්ණනාකරන්නේයි යටහත් සිත් ඇත්තෝ ඒ අසා සන්තෝසවන්නෝයි.

මා සමඟ ස්වාමීන් වර්ණනාකරව්, අපි එක්ව උන්වහන්සේගේ නාමය උසස්කරමු.

ස්වාමීන් සෙවීමි, උන්වහන්සේ මට උත්තරදී, මාගේ සියලු භයින් මා මිදූසේක්.

ඔව්හු උන්වහන්සේ දෙස බලා එළිය ලැබුවෝයි ඔවුන්ගේ මුහුණු කිසි කලකත් ලැජ්ජා නොවන්නේයි.

මේ දුප්පතා මොරගැසුවේය, ස්වාමීන්වහන්සේ ඔහුගේ බස් අසා, ඔහුගේ සියලු දුක්වලින් ඔහු ගැළවූසේක.

ස්වාමීන්ගේ දූතයා උන්වහන්සේට භය ඇත්තන් හාත්පස කඳවුරු බැඳ, ඔවුන් මුදාහරියි.

ස්වාමීන් යහපත් බව රසබලා දැනගනිව්, උන්වහන්සේ කෙරෙහි විශ්වාසකරන මනුෂ්‍යයා ආශිර්වාදලද්දේයි. (ගීතාවලිය 34:1-8)

## 2 පරිච්ඡේදය: ඔබගේ අනාගතය

දුක්ඛිතයාගේ සියලුම දවස් නරකය (කණස්සළු සිතුවිලි හා නපුරු දක්මක් ඇති) ඨ එහෙත් මා තුළ සතුටු සිතක් ඇති බැවින් මා හට නිරන්තර මංගල්‍යයක් ඇත (දැන් පවතින මාගේ තත්ත්වය නොතකා) (හිතෝපදේශ 15:15).

(මා කුමන තත්ත්වයකට පත්වුවද) මා ජීවතුන්ගේ දේශයෙහි ස්වාමීන්ගේ යහපත්කම දකින්ට ලැබේයයි මා විසින් නොඇදහුවෙම්නම් කොපමණ අසරණද?

මම ස්වාමීන් කෙරෙහි බලාසිටිමි, ශක්තිමත්වෙමි, මාගේ සිත ධෛර්‍යමත්වේඨ එසේය, මම ස්වාමීන් කෙරෙහි බලාසිටිමී (ගීතාවලිය 27:13, 14).

ස්වාමීන්වහන්සේ විසින් මා ගැන කරන යෝජනා උන්වහන්සේම දන්නාසේක් මට මතු කාලයේදී බලාපොරොත්තුවක් දීමට ඒවා විපත්තියේ නොව සමාදානයේ යෝජනායයි ස්වාමීන්වහන්සේ කියනසේක් (යෙරමියා 29:11).

එම්බා මාගේ ආත්මය, මක්නිසා මලානිකව ඉන්නෙහිද? මක්නිසා මා තුළ කැලඹෙන්නෙහිද? මම දෙවියන්වහන්සේ කෙරෙහි

බලාපොරොත්තුවෙමිඨ මක්නිසාද මාගේ මුහුණේ සැපදාකවූ, මාගේ දෙවිවූ උන්වහන්සේට තවම ස්තුති ප්‍රශංසා කරන්නෙමී (ගීතාවලිය 42:11).

බලාපොරොත්තුව මා ලැජ්ජාවට නොපමුණුවන්නේයඨ මක්නිසාද මට දෙනලද ශුද්ධාත්මයාණන්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේගේ ප්‍රේමය මාගේ හදවතේ වතුරුවනුලද්දේයී (රෝම 5:5).

මක්නිසාද දෙවිවූ ස්වාමීන්වහන්සේ සූර්යයෙක්ය, පලිහක්යී ස්වාමීන්වහන්සේ අනුග්‍රහයත් මහිමයත් දෙනසේකී මා අවංකලෙස හැසිරෙන බැවින් කිසි යහපතක් මාගෙන් නොවලක්වනසේකී (ගීතාවලිය 84:11).

මා තුළ යහපත් වැඩක් පටන්ගත් උන්වහන්සේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දවස (හරියටම උන්වහන්සේගේ නැවත පැමීනීමේ දවස දවක්වාම) දක්වා ඒක (ඒ යහපත් වැඩය) සම්පූර්ණකරනසේකැයි යන මේ විශ්වාසය ඇතුව මම සිටිමී (පිලිප්පි 1:6).

මක්නිසාද මා වනාහි යහපත් ක්‍රියා කරන පිණිස ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ මවනු (අලුතින් මවන ලද්‍ා) ලැබ දෙවියන්වහන්සේගේ (උන්වහන්සේගේම) කර්මාන්තයව (උන්වහන්සේගේ හස්තකර්මාතයව) සිටිමුවී ඒ යහපත් ක්‍රීයාවල මා හැසිරෙන (උන්වහන්සේ විසින් පෙර මා උදෙසාම සැළසුම් හා සූදානම් කරනලද) පිණිස දෙවියන්වහන්සේ ඒවා කලින් (පෙර සැළසුම් කරනලද) සූදානම්කළසේකී (එපීස 2:10).

මක්නිසාද සියලු කාරණාවලටත් සියලු වැඩවලටත් කාලයක් (නියමිත) පැමිණේයයි මාගේ සිතින් සිතාගත්තෙමී එබැවින් දෙවියන්වහන්සේ කාලයේදී මා උසස්කරන පිණිස උන්වහන්සේගේ බලවත් හස්තයට මම යටත්වෙමී (දේශනාකාරයා 3:17, 1 පේත්‍රැස් 5:6).

මක්නිසාද දෙවියන්වහන්සේගේ සැළසුම් නියම කාලය දක්වා තව ප්‍රමාදවේ එහෙත් එය බොරු නොවී සෙමින, ස්ථිරවම, නිසැකවම තීන්දුවට පැමිණෙන්නේයී එය ප්‍රමාදවෙතත් මම ඒ ගැන බලාසිටින්නෙමිඨ මක්නිසාද එය පසු නොබැස පැමිණෙනවාම ඇතී (හබක්කුක් 2:3).

මෙසේ කළේ දෙවියන්වහන්සේ විසින් බොරුකියන්ට බැරිවූ වෙනස් නොවන කාරණා දෙකක් කරණකොටගෙන, මා ඉදිරියේ තබා තිබෙන බලාපොරොත්තුව අල්ලාගැනීමට ආරක්ෂාව පිණිස පලා ආවාවූ මට මහත් ධෛර්යයක් ලැබෙන පිණිසයි ඒ බලාපොරොත්තුව ආත්මයේ සන්තකවූ, ස්ථිරවූ, තිරයෙන් ඇතුළට යන්නාවූ නැංගුරමක් මෙන් මට ඇත්තේයි (හෙබ්‍රෙව් 6:18, 19).

තවද දෙවියන්වහන්සේට ප්‍රේමකරන මා හට, එනම් උන්වහන්සේගේ සැළසුම හා අරමුණ ලෙස කැඳවනු ලැබූ මා, සියලු දේම යහපත පිණිස එකට (දෙවියන්වහන්සේගේ හස්තයද ඇති මාගේ සියලු වැඩවලදී) ක්‍රියාකරන බව මට සහතිකයක් ඇති බව මම දන්නෙමී (රෝම 8:28).

ඉතින් මා තුළ ක්‍රියාකරන බලයේ (දෙවියන්වහන්සේගේ සැළසුම හා අරමුණ) හැටියට මා ඉල්ලන නොහොත් සිතන (මාගේ යාච්ඤාවන්, ආශාවන්, සිතුවිලි, බලාපොරෝත්තු හෝ සිහිනයන්වලට වඩා) හැම දේට වඩා ඉතා අධිකලෙස (අපිරිමිතව) කරන්ට බලය ඇත්තාවූ දෙවියන්වහන්සේටම, (එපීස 3:20).

එසේය, තමන්ගේ කැමැත්තේ මන්ත්‍රණය හැටියට සියල්ල සිද්ධකරන්නාවූ තැනැන්වහන්සේගේ නියමයේ ප්‍රකාරයට, මා පෙර නියමකරනු (පූර්වයෙන් නියමකර තෝරාගත්) ලැබ ක්‍රිස්තුස්වහන්සේ තුළ (දෙවියන්වහන්සේගේ) උරුමයක්වී (කොටස) සිටිමුවී (එපීස 1:11).

මේ ව්‍යාවස්ථා පොත මාගේ මුඛයෙන් පහනොවේවා, එහි ලියා තිබෙන සියල්ල කරන්ට බලාගන්න පිණිස රෑ දාවල් ඒ ගැන මම මෙනෙහි කරන්නෙමී එවිට මාගේ මාර්ගය සඵලවී මට ශුභ සිද්ධවන්නේයි (යොෂුවා 1:8).

නුමුත් ඒ වචනය ලෙස මා විසින් කරන පිණිස එය මට ඉතා ළංව මාගේ මුඛයේද මාගේ සිතේද තිබේ (ද්විතීය කථාව 30:14).

මාගේ මුඛයෙන් නික්මෙන දෙවියන්වහන්සේගේ වචනයත් උන්වහන්සේ වෙතට හිසිව හැරී නැවිත්, උන්වහන්සේ කැමති දෙය සිදුකොට, උන්වහන්සේ නියම කළ කාරණය සඵලකරනවා ඇතී (යෙසායා 55:11).

මන්ද මම මාගේ මුහුණ වැස්මක් නැතුව, ස්වාමීන්වහනසේගේ තේජස කැඩපතකින් (දෙවියන්වහන්සේගේ වචනය) මෙන් දක්වමින්, ආත්මයාණන්වහන්සේ වන ස්වාමීන්වහන්සේ කෙරෙන් (උන්වහන්සේගෙන්වූ) තේජසින් තේජසට එම ස්වරූපයට වෙනස්කරනු ලබමුවී (2 කොරින්ති 3:18).

මම මේ ලෝකයේ (මේ කාලයේ) ආකාරයට(බාහිර සහ පිටස්තර විලාසිතාවන්ට අනුව සහ හැඩගැසී) සමාන නොවී(වෙනස්වී), දෙවියන්වහන්සේගේ කැමැත්ත එනම් යහපත්වූ පිළිගත යුතුවූ සම්පූර්ණවූ දෙය (මා උදෙසාම) කුමක්ද කියා (මා උදෙසා උන්වහන්සේගේ දර්ශනපථය ඉදිරියේ) දැනගන්නා පිණිස, සිත(මාගේ සම්පූර්ණ සිත) අලුත්කරගැනීමෙන් (නව පරමාදර්ශයන් සහ ආකල්පයන්) අන්‍යාකාර ඇත්තෙක් වන්නෙමි (රෝම 12:2).

අන්‍යජාතීන් අතරේ තිබෙන මේ රහසේ තේජස් සම්පත කිමෙක්ද කියා දෙවියන්වහන්සේ ශුද්ධවන්තයන්ට දන්වන්ට කැමතිවූසේක් ඒ වනාහි තේජසේ බලාපොරොත්තුව (වටහාගැනීම) වන මා තුළ සිටින ක්‍රිස්තුස්වහන්සේයි (කොලොස්සි 1:27).

නැතිදේ ඇති දේ මෙන් දක්වන්නාවූ දෙවියන්වහන්සේ මෙන්, තෝරාගත් ජාතියක, රාජකීය පූජකත්වයක, කැපවූ ජාතියක, දෙවියන්වහන්සේ විසින් මිළට ගත්තාවූ, විශේෂ සෙනඟකයේ කොටස් කරුවකු බව මම ප්‍රකාශකරමි උන්වහන්සේගේ පුදුමාකාර වූ ආලෝකය තුළට අඳුරෙන් මා කැඳවූ දෙවියන්වහන්සේ, උන්වහන්සේගේ පුදුමාකාර ක්‍රියාකාරකම් සහ සදාචාරයේ හා සම්පූර්ණත්වය මාගෙන් ප්‍රදර්ශනය කරන්නේයි (රෝම 4:17, 1පේත්‍රුස් 2:9).

මම වනාහි උන්වහන්සේ විසින් පමුණුවන දවසේදී උන්වහන්සේගෙම සම්පතක් (උන්වහන්සේට අයිති වස්තුවක්, විශේෂිත නිධානයක්) වන්නෙමිඩ ස්වාමීන්වහන්සේද මනුෂ්‍යයෙක් තමාට සේවයකරන තමාගේ පුත්‍රයාට කරුණකරන්නාක් මෙන් මට ද කරුණාකරන බව සේනාවල ස්වාමීන්වහනසේ කියනසේකී (මලාකි 3:17).

පාවුල් මෙන් මම තවමත් අල්ලාගෙන මාගේම කරගත්තේයයි නොසිතමි නුමුත් එකක් දෙයක් (මාගේ අභිලාෂයයි) මම කරමි, එනම්, පස්සෙන් තිනෙ දේ මතකනැතිකොට, ඉස්සරහට තිබෙන ඒවා දෙසම බලාගන යමින්.

ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ උතුම් කැඳවීමේ දිනුම පිණිස දිනුම්පළ (උත්තරීතර හා ස්වර්ගීක) කරා මම දුවමි (පිලිප්පි 3:13, 14).

මම මහත් ඕනෑකමකින්ම පළමු කාරණා සිහි නොකරමි පුරාණ දේවල්ද කල්පනා නොකරමි.

බලව, ස්වාමීන්වහන්සේ අමුතු දෙයක් කරනසේකඩ දැන් ඒක අටගන්නවා ඇතඩ මම ඒක දන්නා අතර ඊට අවධානය දෙන්නෙමි උන්වහන්සේ කාන්තාරයෙහි පවා මාර්ගයක්ද වනයෙහි ගංගාද සාදනසේකී (යෙසායා 43:18, 19).

මම උන්වහන්සේට අයිති බැවින්, ස්වාමීවහන්සේ මාගේ පාපවල් සිහි නොකොට, මාගේ වරද මකාදමනසේකී (යෙසායා 43:25).

නුමුත් මම ස්වාමීන්වහන්සේ (අපෙක්‍ෂාව, බලාසිටීම සහ උන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තු තැබීම) ගැන බලාසිටින්නෙමි මම මාගේ සවිය අලුත්කරගන්නෙමිඩ මම දුවන්නෙම්, එහෙත් වෙහෙස නොවන්නෙමිඩ මම ඇවිදින්නෙමි, එහෙත් ක්ලාන්ත නොවන්නෙමි (යෙසායා 40:31).

දෙවියන්වහන්සේ පොරොන්දුවූ දේ ඉෂ්ටකරන්ට උන්වහන්සේට පුළුවන කියා සම්පූර්ණව හා නිසැකවම විශ්වාසකෙළෙමි මන්ද, මා විසින් සම්පූර්ණ කළයුතුවූ ස්වර්ගීය අභිප්‍රායක් මා හට ඇති බැවිනී (රෝම 4:21).

## 3 පරිච්ඡේදය: ක්‍රිස්තුස්වහන්සේ තුළ ඔබගේ ධර්මිෂ්ඨකම

මා උන්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම වන (දරාගෙන, එසේ දකිමින් සහ ආදර්ශයක් ලෙස) පිණිස පාපයක් නොදත්තාවූ උන්වහන්සේ (ක්‍රිස්තුස්වහන්සේ) මා වෙනුවට පාපය වෙන්ට

(දෙවියන්වහන්සේ) (උන්වහන්සේගේ යහපත්කම කරණකොටගෙන මා එසේ වියයුතුවූ, අනුමතකර පිළිගත්තාවූ සහ උන්වහන්සේ සමඟින් නියම සම්බන්ධතාවයක් පවත්වමින්) සැළස්වූ සේක් (2 කොරින්ති 5:21).

දෙවියන්වහන්ස, ඔබගේ නාමය ලෙසම ඔබගේ ප්‍රශංසාවත් පොළොවේ සීමා දක්වා වේ ඔබගේ දකුණත ධර්මිෂ්ඨකමින් (ධර්මිෂ්ඨ සහ යුක්තිය) පූර්ණයි (ගීතාවලිය 48:10).

අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දවසේදී නුඹලා දෝෂ රහිතව සිටින පිණිස උන්වහන්සේ අන්තිමය (අචල, ශක්තිය ලබාදෙමින්, මාගේ නිර්දෙෂභාවයට සහතිකයක් දෙමින්ධ සියලු දෝෂරෝපණයන් හෝ අධිචෝදනාවලට එරෙහිව මා වෙනුවෙන් ඇපවන්නේ උන්වහන්සේය) දක්වා නුඹලා ස්ථිර කරනසේක් (1 කොරින්ති1:8).

ධර්මිෂ්ඨකමට (ඍජුභාවය හා දෙවියන්වහන්සේ සමඟින් නැගීසිටීම) සාපිපාසා ඇත්තෝ ආශිර්වාදලද්දෝය, වාසනාවන්තයෝය, ප්‍රිතිය ඇත්තෝය, ආත්මීකව සඵලවත්වනුනෝය (නැවත උත්පාදනය ලැබූ උන්වහන්සේගේ දරුවන් උන්වහන්සේගේ පිහිටෝපකාරය හා ගැළවීම අත්විඳින්නේ මේ ආකාරවය) ධ මක්නිසාද ඔව්හු තෘප්තියට පැමිණෙන්නෝයි (මතෙව් 5:6).

මාගේ බර ස්වාමීන් පිට තබන්නෙමි, උන්වහන්සේ මාගේ බර උසුලන (එහි බර මාගෙන් නිදහස්කරනසේක) සේක් උන්වහන්සේ කිසිකලෙකත් (නොකඩවා) ධර්මිෂ්ඨයා සෙලවෙන්ට (ලිස්සීමකට, වැටීමකට, පිරිහෙන්නට) නොදෙනසේක් (ගීතාවලිය 55:22)

(බයිබලය මා උදෙසාද ලියා ඇති එමගින් මට ධර්මිෂ්ඨකමත්, පිළිගතහැකි ආකාරයට දෙවියන්වහන්සේ ඉදිරියේ සිටීමටත්) මක්නිසාද අපේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව මළවුන්ගෙන් නැගිටෙවූ තැනැන්වහන්සේ කෙරෙහි අදහන්නාවූ (විශ්වාස කිරීම, ස්ථිරව සිටීම සහ විශ්වාසය තැබීම) අපටත් එය ගණන්ගනු ලබන්නේයි (රෝම 4:24).

එබැවින් මා ඇදහිල්ලෙන් ධර්මිෂ්ඨ (නිදහස්කොට, ධර්මිෂ්ඨකම ප්‍රකාශකොට, දෙවියන්වහන්සේ සමඟ නියමාකාරයෙන් නැගීසිටීමේ

අයිතිය) කරනු ලැබ, (මම) මාගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ (මෙසියස්වහන්සේ, ආලේපලත් තැනැන්වහන්සේ) කරණකොටගෙන දෙවියන්වහන්සේ හා සමඟ සමාදානය (සමඟිසන්ධානවීම හා එය විඳීම) ඇතුව සිටිමී (රෝම 5:1).

තමාගේ ඇදනැතිකමින් හැසිරෙන්නා ධර්මිෂ්ඨයෙක්යි ඔහුට පසු ඔහුගේ දරුවෝ වාසනාවන්තයෝ (ප්‍රීතිමත්, වාසනාවන්ත, අනුන් විසින් ඊර්ෂ්‍යාකරනු ලබන) වෙති (හිතෝපදේශ 20:7).

මම නිරතුරුවම ධර්මිෂ්ඨව හිඳිනා බැවින් ස්වාමින් වහන්සේ ධර්මිෂ්ටයාව ගළවනු සේකි විපත්ති කාලයේ දී උන්වහන්සේ මාගේ බලකොටුව සහ බලවත් ආරක්ෂාව වන සේකි (ගීතාවලිය 37:39).

මට විරුද්ධව සාදන කිසිම ආයුධයක් සඵල නොවන්නේයඩ විනිශ්චයකිරීමට මට විරුද්ධව නැගිටින සියලුම දිව් මා විසින් වරදට පත්කරනවා ඇති ස්වාමීන්වහන්සේගේ මෙහෙකරුවන්ගේ (ඔහු තුළ නියම ස්වාමීන්වහන්සේගේ මෙහෙකරුවාණන් උත්පාදනය වන්නේයි) උරුමයත් (සමාදානය, ධර්මිෂ්ඨකම, ආරක්ෂාව සහ විරුද්ධවාදීන්ට එරෙහිව ජයග්‍රහණය) උන්වහන්සේගෙන් මට ලැබෙන ධර්මිෂ්ඨකමත් එයාකාරයයි ස්වාමීන්වහන්සේ (මාගේ යුක්තිය වෙනුවෙන් උන්වහන්සේගේ කොටස මෙයයි) කියනසේකී (යෙසායා 54:17).

මම ධර්මිෂ්ඨකෙනෙකු බැවින්, ස්වාමීන්ගේ ඇස් මා දෙසටත් උන්වහන්සේගේ කන් මාගේ මොරගැසීමටත් යොමා තිබේ.

ධර්මිෂ්ඨවූ මම මොරගැසුවෙමී ස්වාමීන්වහන්සේ අසා මාගේ සියලු දුක්වලින් මා ගැළවූසේකී.

(නිරතුරුවම)ධර්මිෂ්ඨයා වන මට පීඩා බොහෝයි නුමුත් ස්වාමීන්වහන්සේ ඒ සියල්ලෙන් මා ගළවනසේකී.

ස්වාමීන්වහන්සේගේ ස්වකීය මෙහෙකරුව මම බැවින් මාගේ ආත්මය මුදනසේකී මම උන්වහන්සේ කෙරෙහි විශ්වාසකරන බැවින් දොස්පැවරීමක් හෝ දෝෂදර්ශනයට පත්කරනු නොලබන්නේයි. (ගීතාවලිය 34:15, 17, 19, 22).

මම ධර්මිෂ්ඨකමෙන් (අයිතිය, දෙවියන්වහන්සේගේ කැමත්ත හා පිළිවෙලේ හැටියට) පිහිටුවනු ලබන්නෙමී මම බලාත්කාරයෙන් දුරුව භය නැතුව සිටින්නෙමිඨ බිය හා භයන්කරයෙනුත් දුරුව සිටින්නෙමි, ඒක මට ළං නොවන්නේයි (යෙසායා 54:14).

මන්ද මම (වෙනසක් නොමැතිව) ධර්මිෂ්ඨව සිටින බැවිනී මම සිංහයෙකු මෙන් නිර්භීතව සිටිමී (හිතෝපදේශ28:1).

මක්නිසාද මට සිටින්නේ මාගේ දුර්වලකම්, අබලදුබලකම් හා පරීක්ෂාවෙන් පහරලබන බව තේරුම් නොගන්නාවූ, දුක්නොවෙන්නාවූ සහ මාගේ හැගීම බෙදානොගන්නාවූ මාගේ දුක නොදැනෙන උත්තම පූජකයෙක් නොව, පව් කිරීමක් නැතුව, සියලු ආකාරයෙන්ම මා වාගේම පරීක්ෂාකරනු ලැබූ උත්තම පූජකයෙක්යි.

එබැවින් මට දයාව ලැබෙන පිණිසද මාගේ ඕනෑකම්වලදී මගේ උපකාරයට (සුදුසු උපකාරය, නියමිත කාලවේලාවට, මට අවශ්‍යම අවස්ථාවේදී) අනුග්‍රහය (මාගේ අසාර්ථකත්වයන්ට)සම්බවන බියක් නොමැතිව, නිසැකකමින් හා නිර්භීතව කරුණාවේ සිංහාසනයට (මා විසින් නොලැබියයුතුවූ) මම ළඟාවෙමී (හේබ්‍රෙව් 4:15,16).

එබැවින් ඊටත් වඩා ක්‍රිස්තුස්වහන්සේගේ ලේ කරණකොටගෙන ධර්මිෂ්ඨකරනු (නිදොස්කොට, ධර්මිෂ්ට කොට හා දෙවියන්වහන්සේ සමඟ නිසි සම්බන්ධතාවයක් ගොඩනගා) ලැබූ මා උන්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේගේ කොපයෙන් හා උදහසෙන් ගළවනු ලබන්නෙමුවී (රෝම 5:9).

දුෂ්ඨයාගේ මන්ත්‍රණය අනුව නොවන්නාවූ, පව්කාරයන්ගේ මාර්ග යෙහි නොසිටින්නාවූ, නින්දාකරන්නන්ගේ ආසනයෙහි නොහිඳින්නාවූ, මම මාගේ කැමැත්තෙන් හා දැඩි ආශාවකින් ස්වාමින්ගේ ව්‍යාවස්ථාවෙහි (ශික්ෂා, මාර්ගෝපදේශ, දෙවියන්වහන්සේගේ ඉගැන්වීම්) ප්‍රීතිවන්නෙමි, උන්වහන්සේගේ ව්‍යාවස්ථාව පුරුද්දක් ලෙසට (ගැඹුරෙන් අධ්‍යනයේ යෙදෙන්නෙමි) රෑ දවල් මෙනෙහි කරන්නාවූ මම ආශිර්වාද ලද්දෙක්මී.

මම දිය ඇළ ළඟ (හොඳින් රැකබලාගත්) හිඳවූ, නියම කලට එලදෙන, නොමැළවෙන කොළ ඇති ගසක් හා සමානවන්නෙමි මම කරන සියල්ල සඵලවේ (නිසි සෙරු තත්ත්වයට පත්වේ) (ගීතාවලිය 1:1-3).

මේ ව්‍යාවස්ථා පොත මාගේ මුඛයෙන් පහනොවේවා, එහි ලියා තිබෙන සියල්ල කරන්ට බලාගන්න පිණිස රෑ දාවල් ඒ ගැන මම මෙනෙහි කරන්නෙමි එවිට මාගේ මාර්ගය සඵලවී මට ශුභ සිද්ධවන්නේයි (යොෂුවා 1:8).

ස්වාමීන්වහන්සේගේ නාමය බලකොටුවක්යධ මම නිරතුරුවම ධර්මිෂ්ඨයෙකුසේ (සෘජු හා දෙවියන්වහන්සේ සමඟ නැගීසිටිය හැකි) එහි දුව ගොස් (යක්ෂයාට වඩා ඉහළින්) ශක්තිමත්ව සුරක්ෂිතව සිටින්නෙමි (හිතෝපදේශ 18:10).

උන්වහන්සේගේ (ක්‍රිස්තුස්වහන්සේගේ) දවස්වලදී (වෙනස් නොවන්නා) ධර්මිෂ්ඨයා මම, සපලවන්නෙමි සඳ නැතිවන තෙක්ම බොහෝ සම්දානයද මට වන්නේයි (ගීතාවලිය 72).

ඒ දවස්වලට පසුව දෙවියන්වහන්සේ විසින් මා සමඟ කරන සම්මුතිය (ගිවිසුම) නම් උන්වහන්සේගේ ව්‍යාවස්ථාව මාගේ සිත්හි තබා, ඒවා මාගේ සිහියේ (සිතුවිලි අභ්‍යන්තරයේ, තේරුම්ගැනීම තුළ) ලියන්නෙමියි ස්වාමීන්වහන්සේ කියනසේකැයි කී පසුණී උන්වහන්සේ කථාකොට:

මාගේ පාපවල් සහ අධර්මිෂ්ඨකම් තවත් සිහි නොකරන්නෙමියි (කමාවත්, දඬුවම අවලංගු කිරීමත්) කියනසේකී.

ඉඳින් ඒවාට කමාව තිබෙන තැන, පාපය ගැන පූජා ඔප්පුකිරීමක් තවත් නැතී (හේබ්‍රෙව් 10:16-18).

එබැවින්, සහෝදරවරුනි, යේසුස්වහන්සේ ස්වකීය මාංසය නමැති තිරය (අති ශුද්ධස්ථානයේ තිරය) මැදින් අප උදෙසා උන්වහන්සේ විසින් ආරම්භකළාවූ කැපකළාවූ මාර්ගය වන අලුත්වූ (නැවුම්) ජීවමාණ මාර්ග යකින්.

උන්වහන්සේගේ ලේ කරණකොටගෙන ශුද්ධාස්ථානයට (අති ශුද්ධාස්ථානය) ඇතුල්වීමට අපට නිදහස්කම තිබෙන බැවින්ද, (හෙබ්‍රෙව් 10:19, 20).

මා උන්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම වන (දරාගෙන, එසේ දකිමින් සහ ආදර්ශයක් ලෙස) පිණිස පාපයක් නොදත්තාවූ උන්වහන්සේ (ක්‍රිස්තුස්වහන්සේ) මා වෙනුවට පාපය වෙන්ට (දෙවියන්වහන්සේ) (උන්වහන්සේගේ යහපත්කම කරණකොටගෙන මා එසේ වියයුතුවූ, අනුමතකර පිළිගත්තාවූ සහ උන්වහන්සේ සමඟින් නියම සම්බන්ධතාවයක් පවත්වමින්) සැළස්වූ සේක් (2කොරින්ති 5:21).

## 4 පර්ච්ඡේදය: බිය පරාජයකිරීම

මක්නිසාද දෙවියන්වහන්සේ මට දුන්නේ බයාදුකමේ (බියගුලු, බියසුලු,බියේ එල්ලී හා ගැතිවූ) ආත්මයක් නොව බලයෙත් ප්‍රේමයෙත් හික්මවීමෙත් (නිශ්චලකමේ හා සමබරවූ මනසක්, විනයක් ඇති සහ ස්වයං පාලනයක් කළහැකි) ආත්මයක්යී (2 තිමෝති 1:7).

මම ස්වාමීන් (විමසුවෙමි) සෙවීමි(මාගේ අවශතාවය හා උන්වහන්සේගේ වචනයේ ආධිපත්‍යයී) උන්වහන්සේ මට උත්තර දී, මාගේ සියළු භයින් මා මිදූ සේක් (ගීතාවලිය 34:4).

මම මාගේ සිත කැලඹෙන්ටවත් භයවෙන්ටවත් නොදෙමී (මම මගේ ස්වීත්වයට කැළඹෙන්ටවත් බාධාවන්ටවත් ඉඩනොතබමී එසේම, මාගේ ස්වීත්වයට බියක් සහ ඇතිකරගනීමටවත් ඉඩ නොසලස්වමී (යොහන් 14:27).

මට භය ඇති කල්හි මම ඔබ කෙරෙහි විශ්වාසකරන්නේමී.

මම දෙවියන්වහන්සේ තුළ (උපකාරයෙන්), උන්වහන්සේගේ වචනය වර්ණනා කරන්නේමී දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබා සිටිමි, භය නොවන්නෙමිඩ මාංසමය වු මනුෂ්‍යයා මට කුමක් කරයිද ? (ගීතාවලිය 56:3, 4).

භයවීමට කිසිත් නැත, මක්නිසාද දෙවියන්වහන්සේ මා සමඟ සිටිනසේකඛ මම තැති නොගනින්නෙමි හෝ නොකැළඹෙන්නෙමි, මක්නිසාද දෙවියන්වහන්සේ මාගේ දෙවියන්වහන්සේයි උන්වහන්සේ මා ශක්තිමත්කොට අසීරුතාවයන්ට මුහුණදීමට මා දැඩි කැන සේක, ඔව් මට උපකාර කරනසේකඛ එසේය, උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම නමැති දකුණතින් මා උසුලනසේකී (යෙසායා 41:10).

නුඹලාට ඇති දෙයින් සතුටුවී, වස්තු තෘෂ්ණාවෙන් තොරව සිටපල්ලා් මක්නිසාදඃ මම කිසිසෙත්(මම කිසිසේත්, මම කිසිසේත්, මම කිසිසේත්), නුඹෙන් අහක්ව නොයමි, කිසි අන්දමකින්වත් නුඹ අත් නොහරිමියි උන්වහන්සේම කියා තිබේ.

මෙසේඃ ස්වාමීන්වහන්සේ මාගේ උපකාරයාණෝයඛ මම භය නොවන්නෙමිඛ මනුෂ්‍යයාමට කරන්නේ කුමක්ද? කියා මහත් ධෛර්‍යයයෙන් යුක්තව කියමුවී (හෙබ්‍රෙව් 13:5, 6)

මක්නිසාද මාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ මට මෙසේ පැවසූසේකඃ භය නොවෙන්න, මම නුඹට පිහිටවන්නෙමියි කියමින් නුඹේ දකුණත අල්ලන්නෙමී (යෙසායා 41:13).

මම භය නොවන්නේමි මන්ද මා සමඟින් උන්වහන්සේද මට සහය වන බවට සහතිකයක්දී ඇති බැවින්, මන්ද මම උන්වහන්සේට ප්‍රේමකරන බැවින් සහ උන්වහන්සේගේ සැළසුමට සහ අරමුණට අන්ව මා කැඳවා ඇති නිසා, සියලුදේම (සැළසුමට සරිලන අයුරින්) යහපත පිණිස එකට ක්‍රියාකරන බව අපි දනිමුවී (රෝම 8:28).

මා සෑදුවාවූ ස්වාමීන්වහන්සේ මෙසේ කියනසේකඃ භය නොවන්නී මක්නිසාද මම නුඹ මුදාගතිමිඛ නුඹේ නම කියා හඬගැසීමි, නුඹ මාගෙ 'යී නුඹ ජල මැදින් යන විට මම නුඹ සමඟ සිටින්නෙමිඛ නුඹ ගංගා මැදින් යන විට ඒවා නුඹට උඩින් ගලායන්නේ නැතී නුඹ ගිනි මැදින් යන විට නොදැවෙන්නෙහියඛ ගිනිදැල්ල කෙරෙහි නොඇවිළෙන්නේයී මක්නිසාද මම නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේය, නුඹේ ගැළවුම්කාරයා වන ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනැන්වහන්සේයඛ (යෙසායා 43:1-3).

ප්‍රේමයෙහි භය ඇත්තේ නැති සම්පූර්ණ ප්‍රේමය භය දුරුකරයි, මක්නිසාද භය දඬුවමින් යුක්තයඩ භයවන තැනැත්තේ ප්‍රේමයෙහි සම්පූර්ණ නොවී සිටියී ක්‍රිස්තුස්වහන්සේ තුළ මාගේ ඇදහිල්ල කරණකොටගෙන නිර්භීතකමත්, සැක නැතුව ළංවන්ට පුළුවන්කමත්, උන්වහන්සේ තුළ මට තිබේ එහෙයින් මාගේ ගෞරවයට හේතුවූ, මා විඳින්නාවූ දුක් ගැන ක්ලාන්ත නොවෙමී භිය නිසා ඇති වන කළකිරීමද ඇතිකරගන්නේ නැතී (1 යොහන් 4:18, එපීස 3:12,13).

දෙවියන්වහන්සේ මාගේ සරණ හා ශක්තියය(බලවත් සහ පරීක්ෂාවට ඇතලුවිය නොහැකි), දුකේදී ඉතා ළංවූ පිහිටක්යී එබැවින් පොළොව වෙනස්වෙතත්, මුහුද මැද පර්වත සැලෙතත්, මම භිය නොවන්නෙමී(ගීතාවලිය 46:1, 2).

මම ශක්තිමත්ව ධෛර්යවත්ව සිටින්නෙමිඩ තැති නොගනින්නෙමි, නොකැලඹෙන්නෙමි, මක්නිසාද මා යන සෑමතැන්හිම මාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ මා සමඟ සිටිනසේකී (යෝෂුවා 1:9).

මම භය නොවන්නෙමි, මන්ද උන්වහන්සේගේ ඇස් මා කෙරෙහියී ස්වාමින් කෙරෙහි මට භය ඇත්තෙමි(ගෞරවය දෙමින් උන්වහන්සේව ඉමහත් නමදින්නෙමී) මන්ද මම උන්වහන්සේගේ කෙරෙහි බලාසිටිමින් උන්වහන්සේගේ දයාව සහ ප්‍රේමාන්විත කරුණාව තුළ බලාපොරොත්තුවන්නෙමී (ගීතාවලිය 33:18-19).

එබැවින් මම හෙට දවස ගැන වද වන්නේ සහ කනස්සලු නොවන්නෙමී හෙට දවස ඒ ගැනම කරදර හා කනස්සලු වන්නේයී දවසේ කරදරය ඒ දවසට සෑහෙයී (මතෙව් 6:34).

මම භය නොවන්නෙමිඩ මක්නිසාද මම ලජ්ජාවට නොපැමිණෙන්නෙමී මම නොකැලඹෙන්නෙමිඩ මම නින්දාවට නොපැමිණෙන්නෙමී මක්නිසාද මම මාගේ යෞවන කාලයේ ලජ්ජාව සිහිනැතිකරන්නෙමි, මාගේ වැන්දඹුකමේ නින්දාවද තවත් සිහි නොකරන්නෙමී මන්ද දෙවියන්වහන්සේ මාගේ ස්වාමිපුරුෂයාව සිටිනසේකී උන්වහන්සේගේ නාමය සේනාවල ස්වාමීන්වහන්සේයී උන්වහන්සේ මාගේ මිදුම්කරුවාණෝයී ඉශ්‍රායෙල්ගේ

ශුද්ධවූ තැනැන්වහන්සේයි උන්වහන්සේ පොළොවේ දෙවියන්වහන්සේයි (යෙසායා 54:4).

මම පරීක්ෂාවට හසුවන බියාදුකමේ හා ඉක්මන්කාරී හදවතක් ඇතිවූ විගස, මම මටම කථාකොටඛ භයනොවී ශක්තිමත්වන්න, භයනොවන්න, බලව, නුඹලාගේ දෙවියන්වහන්සේ පළගැනීම වන දෙවියන්වහන්සේගේ විපාකදීම ඇතුව එනසේකඛ උන්වහන්සේම ඇවිත් නුඹලා ගළවනසේකැයි කියාපල්ලී (යෙසායා 35:4).

මම භයනොවන්නෙමී මන්ද උන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන මාගේ අභ්‍යන්තර මනුෂ්‍යයා තුළ උන්වහන්සේගේ මහිමයේ සම්බතේ ප්‍රමාණයට මා බලයෙන් ශක්තිමත් කොට සවිගන්නවන සේකී (උන්වහන්සේ මාගේ අභ්‍යන්තර ඇතුලු කොට්ඨාශයේ සහ පෞද්ගලීකත්වය තුළ වැඩවාසය කරනසේකී) (එපීස 3:16).

මා සමඟ ස්වාමීන් වර්ණාකරව්, අපි එක්ව උන්වහන්සේගේ නාමය උසස්කරමු ස්වාමීන් සෙව්මි, උන්වහන්සේ මට උත්තරදී, මාගේ සියලු භයින් මා මිදූසේකී (ගීතාවලිය 34:3, 4).

ප්‍රේමයෙහි භය ඇත්තේ නැති නිසා මම භය නොවන්නෙමි(බිය උපදවන දේ එහි නැතී) සම්පූර්ණ ප්‍රේමය භය දොරටුවෙන් පිටතට දුරුකර භයානක තත්ත්වයන් පිටමංකරයී මක්නිසාද භය දඬුවමින් යුක්තියඛ මා භයවන්නේ නැතී මන්ද මා සම්පූර්ණව ප්‍රේමයේ සෙරු ස්වභාවට මා පත්ව ඇතී (ප්‍රේමයෙහි සම්පූර්ණත්වයට පත්ව ඇතී) (1 යොහන් 4:18).

ස්වාමින් වහන්සේ මාගේ ආලෝකයත් ගැළවීමත්යීමම කාට භයවෙම්ද? ස්වාමින් වහන්සේ මාගේ ජීවිතයේ ශක්තියයී මම කාට භයවෙම්ද? නපුරුකම්කරන්නෝ එනම් මාගේ එදිරිකාරයෝ සහ සතුරෝ මාගේ මාංශය කන පිණිස මට විරුද්ධව ආ කළ පැකිළ වැටුණෝයී.

සේනාවන් මට විරුද්ධව කඳවුරු බැන්දත්, මාගේ සිත භය නොවන්නේයී මට විරුද්ධව යුද්ධයක් හටගත්තත් මම සුරක්ෂිතව සිටින්නෙමී.

මක්නිසාද, විපත්ති දවසේදී උන්වහන්සේ ස්වකීය විමානයෙහි මා වසා තබන සේකී ස්වකීය මණ්ඩපයෙහි වූ අප්‍රකාශය ස්ථානයෙහි මා

සඟවන සේක් උන්වහන්සේ පර්වතයක් පිට මා ඔසවා තබන සේක් දැනුදු මා අවට සිටින මාගේ සතුරන්ට ඉහළින් මාගේ හිස ඔසවනු ලබන්නේයි උන්වහන්සේගේ මණ්ඩපයෙහි ප්‍රීති පූජා පුදන්නෙමි ස්වාමින්ට ගීතිකා කරන්නෙමි එසේය, ප්‍රශංසා ගී කියන්නෙමි (ගීතාවලිය 27:1-3, 5, 6).

මම භය නොවන්නෙමිඛ මක්නිසාද මම තේරුම්ගන්ටත් මාගේ දෙවියන්වහන්සේ ඉදිරියෙහි යටත්වෙන්ටත් මාගේ සිත යොමුකරගත් පළමුවෙනිදා සිට මාගේ වචන අසනු ලැබීයි දෙවියන්වහන්සේද මාගේ වචන නිසා උන්වහන්සේගේ දූතයාව(ඊට ප්‍රතිචාර දක්වමින්) එවූසේක් (දානියෙල් 10:12).

සිනගෝගවලටද ප්‍රධානීන් හා ආණ්ඩුකාරයන් ඉදිරියටද මා ගෙනයන කල, උත්තර දෙන්නෙ කෙසේද කියාවත් කියන්නේ කුමක්ද කියාවත් සිතා කනගාටු නොවෙල්ලී (ලූක් 12:11).

ස්වාමින් වහන්සේ මාගේ එඬෙරාණෝයි මට හිඟයක් නොවන්නේයි.

උන්වහන්සේ තිල් ගොදුරු බිම්වල මා ලගින්නට සළස්වන සේක් නිශ්චලවූ දිය අසළින් මා ගෙනයන සේක්.

උන්වහන්සේ මාගේ ආත්මය ප්‍රාණවත් කරන සේක් ස්වකීය නාමය නිසා ධර්මිෂ්ටකමේ මාවත්වල මා ගෙන යන සේක්.

එසේය, මරණ සෙවනේ මිටියාවත මැදින් යන්නෙම් නමුත්, කිසි උපද්‍රවයකට භය නොවන්නෙමි මක්නිසාද ඔබ මා සමගයි ඔබගේ දණ්ඩයෙන් හා සැරයටියෙන් මට සැනසිල්ල ලැබේ.

මාගේ සතුරන් ඉදිරියෙහි ඔබ මට කෑම මේසයක් පිළියෙල කරන සේක් මාගේ හිස තෙලින් ආලේප කල සේක් මාගේ කුසලානය උතුරා යයි.

සැබවින් යහපත්කමත් කරුණාවත් මාගේ ජීවිතයේ සියළු දවස්වල මා අනුව එන්නේයි මා සදාකල්ම ස්වාමින්ගේ ගෘහයෙහි සදාකල්හිම වාසය කරන්නේයි (ගීතාවලිය 23:1-6).

## නිගමනය:

ක්‍රිස්තුස්වහන්සේ අප මුදාගත්තේ නිදහස්කම ඇතුව සිටීමටයි එබැවින් දාසකම නමැති වියගහකට නැවත අසු නොවී ස්ථිරව සිටපල්ලා (ගලාති 5:1).

එබැවින් මහත් විපාකයක් (සම්පූර්ණ ලෙසින්) ඇත්තාවූ නුඹලාගේ නිසැකකම අත් නාරිල්ලා.

මක්නිසාද දෙවියන්වහන්සේගේ කැමැත්ත කළ පසු පොරොන්දුව ලබන පිණිස නුඹලාට ඉවසිල්ල ඕනෑයි (10:35, 36).

# බයිබල් පද පරිශීලනය

ඎඤඣ ලෙසින් සලකුනුකර ඇති ශුද්ධලියවිලි කොටස් කිං ජේම්ස් අනුවාද බයිබලයෙන් උපුටාගන්නා ලදී.

ඔබර් ලෙසින් සලකුනුකර ඇති ශුද්ධලියවිලි කොටස් ද ලිවිං බයිබල් 1971 අනුවාද බයිබලයෙන් උපුටාගන්නා ලදී ටින්ඩේල් හවුස් පබ්ලිෂස් වීටන්, ඉලිනොයිස් 60189 වෙතින් නිසි අවසර ඇතිව පරිශීලනය කර ඇතී සියලු හිමිකම් ඇවරිනී.

හී ලෙසින් සලකුනුකර ඇති ශුද්ධලියවිලි කොටස් නිව් ඇමරිකන් ස්ටෑන්ඩඩ් බයිබලයේ උපුටාගන්නා ලදී හිමිකම් ද ලොක්මන් ෆවුන්ඩේෂන් 1960, 1962, 1963, 1968, 1971, 1972, 1973, 1975, 1977 නිසි අවසර ඇතිව පරිශීලනය කර ඇතී.

# කෘතුවරිය පිළිබඳව

ජොයිස් මේයර් ප්‍රායෝගීක බයිබල් ගුරුවරිය ලෙසට ලොකයේ ඉදිරිෙ-යන්ම සිටියී නිව් යෝර්ක් ටයිම්ස්හි හොඳම කතුවරියක් වන අතර, ඇගේ කෘතීන් කරණකොටගෙන මිලියන ගනනක ජනතාවට යේසුස්වහන්සේ තුළින් බලාපොරොත්තුවක් හා ප්‍රතිස්ථාපනය ඇතිකිරීමට බලපෑමක් ඇති කළේයී ජොයිස් මේයර් සේවය තුළින් ඇය මනස, මුඛය, සිතේ ස්වභා-වයන් සහ ආකල්ප වැනි මාතෘකාවන් කේන්ද්‍රීකරගෙන ඉගැන්වීම් කරයී ඇයගේ ආකර්ශණීය සන්නිවේදන ආකාරය නිසාම තමන්ගේ ජීවිතයෙන් ලත් අත්දැකීම් තවත් අයගේ ජීවිත වෙනස් කරන පිණිස ඇය නොපැකිලව බෙදාගන්නීයී කෘතීන් 100ට ආසන්න සංඛ්‍යාවකට කතෘත්වයෙන් උරුමය කියන අතර, විවිධ භාෂා 100ට පමණ පරිවර්තනයකර ඇතී සෑම වර්ෂයකදීම ඇය විසින් ජාතික සහ ජාත්‍යන්තරව සම්මේලන පවත්වන අතර, එමගින් බොහෝ මනුෂ්‍යයන්ට දෛනික ජීවිතය විඳිමේ අධ්‍යනයන් ඉන් ඉදිරිපත් කරයී පසුගිය තිස් වසර තුළ පැවත්වූ, ඇයගේ සේවය විසින් සංවිධානය කරනු ලබන වාර්ෂීක කාන්තා සම්මේලන තුළින් ලොව පුරා විසිරී සිටිනා කාන්තාවන් 200,000ට පමණ සහභාගිවීමට අවස්ථාව සැළස්සුවායී ඇයගේ අතුරු සේවයක් වන හැන්ඩ් ඔෆ් හෝප් හි දර්ශනය මූලිකම පදනම්ව ඇත්තේ ඒ සේවයට ඇති ඇයගේ දැඩි කැමැත්තයී එසේම, මිෂන් ආම් ඔෆ් ජොයිස් මේයර් සේවය මගින් ලොව පුරා මෙන්ම ඇයගේ උපන් ප්‍රදේශය වන සාන්ත ලුවිස් හිද ශුභාරංචිය ගෙනයාමේලා නිරතව සිටියී

To contact the author in the United States, please write:
Joyce Meyer Ministries
P.O. Box 655,
Fenton, Missouri 63026
or call: (636) 349-0303
or log on to: www.joycemeyer.org

**Go to tv.joycemeyer.org**
**to watch Joyce's messages in a variety of languages**

To contact the author in India, please write:
Joyce Meyer Ministries
No. 125, St. Joseph's Street,
Grandpass, Colombo - 14
T.P.No: 011 - 2336749
Srilanka